*සැ. යු.* - 2014.07.25 දින පළ වූ අංක 1,873 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,874 - 2014 අගෝස්තු මස 01 වැනි සිකුරාදා - 2014.08.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1260 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1265 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1269 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1272 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1279 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1259- B 80861- 2,875 (2014/08)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන නිවේදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත පිග් අයන් (Pig Iron) මෙට්‍රික් ටොන් 100ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F 7029

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත පිග් අයන් මෙට්‍රික් ටොන් 100ක් සැපයීමේ ප්‍රසම්පාදනය සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ තැ. පෙ. අංක 355, දුම්රිය සේවා මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු සඳහා දැන් ඇරයුම් කෙරේ. ඇටෝර්නි බලය පවරනු ලැබූ පිළිගත් නියෝජිතයෙකු මගින් නිෂ්පාදකයින්ට තම ලංසු භාර දිය හැක.

02. 2014 සැප්තැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කරනු ලැබේ.

03. ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුව වූ රු. 2,500 හෝ ඒ සමාන නිදහසේ පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයට හෝ ශ්‍රී ලංකා විදේශ කාර්යාලය වෙත, 2014 සැප්තැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 3.00 ට පෙර ගෙවා ලබාගන්නා ලද ලංසු ආකෘති මත සටහන් කරන ලද ලංසු පමණක් භාරදිය යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් කළ වහාම, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය සේවා මූලස්ථානයේදී එම ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙම අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු, ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙන විත් පහත ලිපිනයට භාරදිය යුතුයි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිමනත් තොරතුරු සඳහා කරුණාකර පහත සඳහන් ලිපිනය හා සම්බන්ධ වන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11)2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway. gov.lk
යොමු අංකය :SRS/F 7025

08-204

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන නිවේදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඩෝග් ස්පයික්ස් (Dog Spikes) 300,000 සහ ඇණ සහ මුරිච්චි 57,000ක් මිළ දී ගැනීම**

ඩෝග් ස්පයික්ස් (Dog Spikes) 300,000 සහ ඇණ සහ මුරිච්චි 57,000ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි. ලංසුකරුවන්ට ඔවුන්ගේ ලංසු සෘජුවම හෝ ඇටර්නි බලපත්‍රයක් මගින් බලය පවරනු ලැබූ ලංකාවේ ලියාපදිංචි වී ඇති පිළිගත් නියෝජිතයෙකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකි ය.

02. ආපසු නොගෙවන ලියකියවිලි ගාස්තුවක් වන ශ්‍රී ලංකා රුපියල් 3,000.00ක් හෝ ඒ හා සමාන පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදලක් ගෙවීමෙන් 2014.09.09 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 3.00 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි තිබෙන ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙතින් ලබාගත හැකි පෝර්මවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

03. 2014.09.10 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වේ.

04. ඩෝග් ස්පයික්ස් සහ ඇණ සහ මුරිච්චි නිෂ්පාදනය/සැපයීම් භාරගත යුත්තේ ISO 9001 : 2008 සහතික ලත් හෝ මිලදී ගන්නාට පිළිගත හැකි සමාන තත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිතියක් ඇති සමාගම්වලට පමණි.

05. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කරනු ඇත. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණෙන ලෙස ලංසු තබන්නන්ට හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් අතින් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කොට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

07. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ගාස්තු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී සිදුකළ හැකි අතර වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් පරිදි විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11)2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය :SRS/F. 7128

08-209

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු ආරාධනය

**(GOSL** විසින් අරමුදල් සපයන ව්‍යාපෘති)

සාමාන්‍යාධිකාරී

දුම්රිය සේවා මූලස්ථානය,

ශ්‍රී ලංකා දුම්රිය සේවය ඕල්කට් මාවත, කොළඹ 10

**දුම්රිය ස්ථාන හා ගොඩනැගිලි හා වේදිකා සංවර්ධනය කිරීම**

පහත විස්තර කරන ලෙස කොන්ත්‍රාත් අංක SRS/F-7151 යටතේ නුගේගොඩ දුම්රිය ස්ථාන වේදිකාවන් සංවර්ධනය කිරීම සඳහා, කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සේවා මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන), සභාපති තැන විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා දැන් ඇරයුම් කෙරේ. නුගේගොඩ දුම්රිය ස්ථානයේ කාර්යයන් සාධනය කිරීම සඳහා කටයුතු සකස් කරනු ඇත.

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා යෝග්‍යතාපූර්ණත්වය ලැබූ සාර්ථක ලංසුකරුවා අසාධු ලේඛන ගත නොවී සිටිය යුතු අතර පහත සඳහන් කොන්දේසි සපුරා තිබිය යුතුයි.

ගොඩනැගිලි ඉදිකිරීම් හා /හෝ නිමවුම් කාර්යයන් (Finishing Trades) සඳහා F 1 විශේෂඥතාවය සහිත C 5 හෝ ඉන් ඉහළ ශ්‍රේණියක ඉදිකිරීම්, අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචිය ලබා තිබිය යුතුයි.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවයන්ට පහත සඳහන් කරුණු ඇතුලත් වේ.

*(අ)* පසුගිය පස්වසර තුළ සාධනය කරන ලද ඉදිකිරීම් කාර්යයන්හි සාමාන්‍ය වාර්ෂික ධාරිතාව අවමයෙන් රු. මිලියන 200ක් විය යුතුයි.

*(ආ)* ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් පසුගිය වසර දහය තුළ සාධනය කරන ලද සමාන ස්වභාවයේ හා සංකීර්ණත්වයෙන් යුත් නවීකරණ /ඉදිකිරීම් පිළිබඳ එක් කොන්ත්‍රාත්තුවක් පිළිබඳව පළපුරුද්ද තිබිය යුතුයි.

*(ඇ)* අනෙකුත් කොන්ත්‍රාත් වගකීම් සඳහා වෙන්කිරීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන අත්තිකාරම් ගෙවීම් හැර තිබිය යුතු අවම ණය පහසුකම් ප්‍රමාණය රු. මිලියන 15කට අඩු නොවිය යුතු අතර මෙය එම ව්‍යාපෘතියට පමණක් විශේෂිත විය යුතුයි.

*(ඈ)* කාර්යය ස්ථානයේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පහත දැක්වෙන අය සිටිය යුතුයි.

1. NDT, HNDE, NDES හෝ සමාන සුදුසුකම් හා 5 වසරක පළපුරුද්දැති තාක්ෂණ නිලධාරියෙක්,
2. NCT හෝ සමාන සුදුසුකමැති වසර තුනක පළපුරුද්දැති එක් කාර්ය සුපවයිසර්වරයෙකු.

05. මෙයට රුචිය දනවන ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිමනත් තොරතුරු කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අංක 01 දරන ස්ථානයේ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කාර්යයන් ගෙන් ලබාගත හැකි අතර, ලංසු ලියවිලි පරීක්ෂාව පහත දැක්වෙන ලිපිනයේ දී සතියේ දිනවල 900 හා 1500 පැය අතර සිදුකළ හැක.

06. ආපසු නොගෙවන රු. 3,000ක් මුදලින් ගෙවා, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී තැනගෙන් 2014.07.15 වැනි දින සිට 2014.08.19 වැනි දින දක්වා 900 හා 1500 පැය අතරතුර ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලියවිලි කට්ටලයක් මිල දී ගත හැක. නුගේගොඩ දුම්රිය නැවතුම් ස්ථානයේ වේදිකාවන් සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා දුම්රිය සේවය - ප්‍රවාහන අමාත්‍යාංශය.

07. 2014.08.20 වැනි දින 1400 පැයට හෝ ඉන් පෙර ලැබෙන සේ සියලුම ලංසු පහත ලිපිනය වෙත භාරදිය යුතුයි.

ප්‍රමාදිත ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් කළ විගස ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිට දී එම ලංසු විවෘත කරනු ලැබේ.

සභාපති තැන,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
තැ. පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10,

08. රු. එක් ලක්ෂ පනස් දහසක් (රු. 150,000) වටිනා ලංසු භාරගන්නා අවසන් දින සිට දින 150ක් වලංගු ලංසු සුරක්ෂණයක් සෑම ලංසුවක් සමගම භාරදිය යුතුයි. තවද සියලුම ලංසු දින 120කට වලංගු විය යුතුයි.

09. ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කාර්යයන්) කාර්යාලයේ දී 2014.08.03 වැනි දින 1000 පැයට පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

සභාපතිනිය,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
තැ. පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

08-208

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ටෙන්ඩර් දැන්වීම

**මරදාන දුම්රිය ගබඩාවල හිස්බැරල් හා දැවි තෙල් බැහැර කිරීම**

01. මරදාන දුම්රිය ගබඩාවල ඇති හිස් බැරල් 1,000ක් හා දැවිතෙල් ලීටර් 68,800 ක් බැහැර කිරීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සේවා මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති තැන විසින් මුද්‍රාතබන ලද ලංසු මෙයින් කැඳවනු ලැබේ.

02. 2014.08.15 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

03. 2014.08.14 වැනි දින ප. ව. 3.00 දක්වා ගෙවිය හැකි ආපසු නොගෙවන රුපියල් දෙදහසක (රු. 2,000) ලියවිලි ගාස්තුවක් ගෙවා, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගන්නා ආකෘතිපත්‍රවල සටහන් කරන ලද ලංසු පමණක් භාරදිය යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් කළ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය සේවා මූලස්ථානයේ දී එම ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි විය හැක.

05. මුද්‍රා තබන ලද ලංසු, ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් රැගෙනවිත් පහත ලිපිනයට භාරදිය හැක.

සභපති,
ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කට් මාවත,
කොළඹ 10,

06. කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිමනත් තොරතුරු සඳහා දුරකථන අංක 94 (11) 2438078/2436818 ෆැක්ස් අංකය 94(11)2432044 ඔස්සේ, කොළඹ 10 ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ. දුම්රිය ගබඩා අධිකාරී තැන අමතන්න.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය :SRS/F. 7132 Vol.I

08-206

**ලංසු ආරාධනය**

**(GOSL** අරමුදල් සපයන ව්‍යාපෘති)

සාමාන්‍යාධිකාරී

දුම්රිය සේවා මූලස්ථානය,

ශ්‍රී ලංකා දුම්රිය සේවය ඕල්කට් මාවත, කොළඹ 10

**දුම්රිය ස්ථාන, ගොඩනැගිලි හා වේදිකාවන් සංවර්ධනය කිරීම**

කොන්ත්‍රාත් අංක **SRS/F. 7153** යටතේ පහත සඳහන් පරිදි හෝමාගම දුම්රිය ස්ථානයේ වේදිකාවන් සංවර්ධනය කිරීම සඳහා කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සේවා මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන), සභාපති තැන විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා ඔබ වෙත ඇරයුම් කෙරේ. හෝමාගම දුම්රිය ස්ථානයන්හි කාර්යයන් සාධනය කිරීමට කටයුතු සලසා ඇත. කොන්ත්‍රාත් කාලය දින 120කි.

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබූ සාර්ථක ලංසුකරුවා අසාධු ලේඛන ගත නොවී සිටිය යුතු අතර පහත සඳහන් කොන්දේසි සපුරා තිබිය යුතුයි.

ගොඩනැගිලි ඉදිකිරීම් හා /හෝ නිමවුම් කාර්යයන් (Finishing Trades) සඳහා F 1 විශේෂඥතාවය සහිත C 5 හෝ ඉන් ඉහළ ශ්‍රේණියක ඉදිකිරීම්, අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචිය ලබා තිබිය යුතුයි.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවයන්ට පහත සඳහන් කරුණු ඇතුලත් වේ.

*(අ)* පසුගිය පස්වසර තුළ සාධනය කරන ලද ඉදිකිරීම් කාර්යයන්හි සාමාන්‍ය වාර්ෂික ධාරිතාව අවමයෙන් රුපියල් මිලියන 200ක් විය යුතුයි.

*(ආ)* ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් පසුගිය දස වසර තුළ සාධනය කරනු ලැබූ සමාන ස්වභාවයේ හා සංකීර්ණත්වයෙන් යුත් නවීකරණ /ඉදිකිරීම් සම්බන්ධව එක් කොන්ත්‍රාත්තුවක් පිළිබඳව පළපුරුද්ද තිබිය යුතුයි.

*(ඇ)* අනෙකුත් කොන්ත්‍රාත් බැඳීම් සඳහා වෙන්කිරීම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන අත්තිකාරම් ගෙවීම් හැර තිබිය යුතු අවම ණය පහසුකම් ප්‍රමාණය රුපියල් මිලියන 15කට අඩු නොවිය යුතුය. තවද එය මෙම ව්‍යාපෘතියට විශේෂිත විය යුතුයි.

*(ඈ)* කාර්යය ස්ථානයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය පහත දැක්වෙන අයුරින් සමන්විත විය යුතුයි.

1. NDT, HNDE, NDES හෝ සමාන සුදුසුකම් සහිත පස් වසරක පළපුරුද්දැති එක් තාක්ෂණික නිලධාරියෙක්,
2. NCT හෝ සමාන සුදුසුකම් සහිත පස් වසරක පළපුරුද්දැති එක් කාර්ය සුපරවයිසර්වරයෙක්.

04. මෙයට රුචිය දනවන ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිමනත් තොරතුරු කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අංක 01 දරන ස්ථානයේ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කාර්යයන්) වෙතින් සතියේ දිනවල දී ලබාගත හැකි අතර ලංසු ලියවිලි පරීක්ෂාව ද පහත සඳහන් ලිපිනයේ දී සතියේ දිනවල 900 හා 1500 පැය අතර සිදුකළ හැක.

06. ආපසු නොගෙවන රු. 3,000ක් මුදලින් ගෙවා, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී තැන වෙත කරනු ලබන ලිඛිත අයදුම්පතක් මගින්, මෙයට අභිරුචිය දක්වන ලංසුකරුවනට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලියවිලි කට්ටලයක් 2014.07.15 වැනි දින සිට 2014.08.13 වැනි දින දක්වා 9.00 හා 1500 පැය අතරතුර මිලදී ගත හැක.

07. 2014.08.14 වැනි දින 1400 පැයට හෝ ඉන් පෙර ලැබෙන සේ සියලුම ලංසු පහත ලිපිනය වෙත භාරදිය යුතුයි. ප්‍රමාදිත ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් කළ වහාම, ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිට දී එම ලංසු විවෘත කරනු ලැබේ.

සභපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
තැ. පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10,

08. සියලුම ලංසු ලංසුභාරගන්නා අවසන් දින සිට ඉදිරියට දින 119ක් වලංගු රු. එක්ලක්ෂ පනස් දාහක් (රු. 150,000) වටිනා ලංසු සුරක්ෂණයක් හා භාරදිය යුතුයි. තවද එම ලංසු දින 91ක් දක්වා වලංගු විය යුතුයි.

09. 2014.08.13 වැනි දින 1000 පැයට ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කාර්යයන්) කාර්යාලයේ දී පූර්ව ලංසු රැස්වීමක් සංවිධානය කොට ඇත.

සභාපතිනිය,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
තැ. පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

08-207

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවයට සික්ස් හෝල්ඩ් ජන්ක්ෂන් ෆිෂ් ප්ලේට් යුගල 1,000ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

01. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි, සභාපති විසින් පහත සඳහන් අයිතම මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

| *අයිතම අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| (i) | 80/90 A Ibs. six Holed Junction Fish Plates | යුගල 500 Pairs |
| (ii) | 88/90A Ibs. six Holed Junction Fish Plates | යුගල 500 Pairs |

ලංසුකරුවන්ට ස්වකීය ලංසු, ඍජුව හෝ ඇටර්නි බලය මගින් බලය පවරන ලද සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් නියෝජිතවරයෙකු මගින්, ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු, ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රුපියල් 3,000ක් පමණක් වන සේ පහසුවෙන්, පරිවර්තනය කර ගතහැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකමින් යුත්, ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2014.09.11 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයක ශ්‍රී ලංකා දූත මණ්ඩලයකින් ලබාගත හැකි ආකෘතිපත්‍ර මත ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාර ගැනීම 2014.09.12 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් වේ.

04. සිදුරු හයක් සහිත සන්ධිගත රේල් පීලි ආදින යකඩ තහඩු නිෂ්පාදනය කිරීම හා සැපයීම, ISO 9001 : 2008 සහතිකලත් හෝ ගැණුම්කරුට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර (අන්තර් ජාතික) තත්ත්ව කළමනාකරණ (ක්‍රම) පද්ධති ප්‍රමිතියකින් යුත් සමාගම් විසින් සිදුකළ යුතු ය.

05. ලංසු එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මූලස්ථානයේ දී විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

07. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී, නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි වන අතර, වැඩිදුර විස්තර සඳහා කරුණාකර මෙසේ විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන අංක 94 (11) 2438078 හෝ
94 (11) 2436818

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය :SRS/F. 7136.

08-205

## මහාධිකරණය - අනුරාධපුර

### රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම

මෙම අධිකරණ කලාපයට අයත් තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත මෝටර් වාහන විකිණීම සඳහා ලංසු කැඳවනු ලැබේ :-

| අනු. අංකය | අධිකරණය | නඩු අංකය | වාහනය | ටෙන්ඩර් ඇප තැන්පත් ආපසු ගවන | ආපසු නොගෙවන |
|---|---|---|---|---|---|
| 01. | කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | 77684 | 43-7056 ලේලන්ඩ් වර්ගයේ ලොරි රථය | 10,000.00 | 100.00 |
| 02. | කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | 59834 | 26-1601 ටාටා ලොරි රථය | 10,000.00 | 100.00 |
| 03. | කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | 80576 | 226-5442 ටොයෝටා තට්ටු ලොරි රථය | 10,000.00 | 100.00 |
| 04. | කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | 86134 | NWQT 7012 බජාජ් ත්‍රී රෝද රථය | 5,000.00 | 100.00 |
| 05. | කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | A 93/11 | UR -2604 පල්සර් යතුරු පැදිය | 2,000.00 | 100.00 |
| 06. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 66709 | 40-2645 ලොරි රථය | 10,000.00 | 100.00 |
| 07. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 5569 | 26-9394 ලොරි රථය | 10,000.00 | 100.00 |

01. 2014 අගෝස්තු මස 04 වැනි දින සිට 2014 අගෝස්තු මස 18 වැනි දින දක්වා සතියේ වැඩ කරන දින වල පෙ. ව. 10.00 සිට ප. ව. 1.00 දක්වා තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී සහ කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ඉහත සඳහන් වාහන පරීක්ෂා කර බැලිය හැකි ය.

02. එක් එක් වාහනය සඳහා ඉහත දැක්වෙන පරිදි ආපසු නොගෙවන තැන්පත් මුදලක් තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයට, කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයට හෝ අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලදුපත් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර ලංසු ආකෘති පත්‍ර 2014 අගෝස්තු මස 04 වැනි දින සිට 2014 අගෝස්තු මස 18 වැනි දින පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ ලබාගත හැකි අතර එම කාලය තුළ දී ආපසු ගෙවන තැන්පත් මුදල අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලබාගන්නා ලදුපත ලංසු අයදුම්පතට ඇමිණිය යුතු ය.

03. එක් එක් වාහනය සඳහා වෙන වෙන ම ලංසු ඉදිරිපත් කළ යුතු අතර ලංසු කොන්දේසි පරිදි සම්පූර්ණ කොට මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතු ය. එම මුල් කවරයේ වම් පස ඉහළ කෙළවරේ " මෝටර් වාහන සඳහා මිල ගණන්" ලෙස ද වාහනයේ අංකය ද සඳහන් කර 2014 අගෝස්තු මස 19 වැනි දින පෙ. ව. 11.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය,
අනුරාධපුර.

04. එදිනම පෙ. ව. 11.30 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

ධම්මික ගනේපොල,
මහාධිකරණ විනිසුරු,
අනුරාධපුර.

2014 ජූලි මස 14 වැනි දින,
අනුරාධපුර මහාධිකරණයේ දී ය.

08-72

**මහාධිකරණය - නුවරඑළිය**

නුවරඑළිය මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2014 අගෝස්තු මස 25 වැනි දින දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

02. එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවන රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත් හා විස්තර නුවරඑළිය මහාධිකරණයෙන් ලබා ගත යුතු ය. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2014 අගෝස්තු මස 22 වැනි දින දක්වා පමණි.

03. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, අදාළ මුදල උපලේඛනයේ දක්වා ඇත. ටෙන්ඩර් පත්‍රයේ පිටපත් දෙක සමග මුදල් ගෙවන ලද කුවිතාන්සි, ඡායා පිටපතක් ද අමුණා එවිය යුතු අතර ටෙන්ඩර්පත් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ " වාහන සඳහා මිළ ගණන්, වාහන අංකය ................." යනුවෙන් සඳහන් කර නුවරඑළිය මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. වාහන පරීක්ෂා කිරීම 2014 අගෝස්තු මස 22 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල දී හැටන් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ දී පරීක්ෂා කළ හැකි ය.

05. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි අතර, 2014 අගෝස්තු මස 28 වැනි දින ප. ව. 1.30 නුවරඑළිය මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

06. ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දීම ලැබී දින 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම ගෙවා වාහන ඉවත් කර ගත යුතු ය.

07. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක : 051 - 2222291 ඔස්සේ හැටන් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත හැකි ය.

*උපලේඛනය*

| *නඩු අංකය* | *වාහන ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *ඇප තැන්පතුව රුපියල්* | *වාහන පරීක්ෂා ස්ථානය* |
|---|---|---|---|---|
| 59817 | 43-0958 | ලොරි රථය | 2,000.00 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |
| 57496 | CP QC 7746 | ත්‍රිවිල් රථය | 1,000.00 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |
| 57576 | 43-9336 | ලොරි රථය | 5,000.00 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |

ඊ. ඩබ්. එම්. ලලිත් ඒකනායක,
මහාධිකරණ විනිසුරු (මධ්‍යම පළාත),
නුවරඑළිය.

2014 ජූලි මස 09 වැනි දින,
නුවරඑළිය මහාධිකරණයේ දී ය.

08-09

---

# බඩු බාහිරාදිය විකිණීම්

**වත්තල මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාල රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයා ගත නොහැකි වූ පහත සඳහන් නඩු භාණ්ඩ 2014.08.16 වැනි දින පෙ. ව. 9.30 ට වත්තල පැරණි අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහිදී වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් පාන අයෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 8.30 සිට පෙ. ව. 9.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිළ දී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. අදාළ කාලය තුළ රාජසන්තක කරන ලද භාණ්ඩ වුවහොත් මෙම ලැයිස්තුවට ඇතුළත් කළ හැකි ය.

කේ. එස්. ලංකා ජයරත්න,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - වත්තල.

2014 ජූලි මස 09 වැනි දින,
වත්තල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | තක්සේරු මුදල රු.ශත |
|---|---|---|---|
| 01. | 72369 | 21-0785 බජාජ් කොළ පාට ත්‍රිවිල් රථය | 20,000 |
| 02. | 56914 | 21-7375 බජාජ් රතුපාට ත්‍රිවිල් රථය | 20,000 |
| 03. | A 1104/12 | 204-5920 බජාජ් රතු පාට ත්‍රිවිල් රථය | 10,000 |
| 04. | 67109 | 202-2612 බජාජ් නිල්පාට ත්‍රිවිල් රථය | 25,000 |
| 05. | A 1101/12 | HW 5723 බජාජ් ත්‍රිවිල් රථය | 28,000 |
| 06. | A 1096/12 | 118-9276 යමහා නිල්පාට යතුරුපැදිය | 10,000 |
| 07. | A 1095/12 | 93-7999 යමහා කලුපාට යතුරුපැදිය | 7,000 |
| 08. | A 1736/12 | MY 0747 බජාජ් ඩිස්කවරි රතුපාට යතුරුපැදිය | 10,000 |
| 09. | A 1738/12 | වැ. අ. MX 200A006359<br>වැ. අ. MX 200AE006760<br>කවසාකි නිල් සුදු යතුරුපැදිය | 8,000 |
| 10. | A 1097/12 | JO 0361 හීරෝ හොණ්ඩා නිල්පාට යතුරුපැදිය | 10,000 |
| 11. | A 1098/12 | 107-4785 යමහා කලුපාට යතුරුපැදිය | 3,000 |
| 12. | A 1102/12 | 104-6082 හොණ්ඩා සිල්වර් පාට යතුරුපැදිය | 6,000 |

**රන් භාණ්ඩ**

| | | | |
|---|---|---|---|
| 13. | AR 1172/13 | දඟර සහිත රත්රන් චේන්එක සමග ඇතිකුඩා පෙන්ඩන්ට් දෙකයි | රන් අගය අනුව තක්සේරු නොහැක |
| 14. | AR 1172/13 | ගල් දෙකක් අල්ලන ලද කාන්තා රන්මුදු එකයි | රන් අගය අනුව තක්සේරු නොහැක |
| 15. | AR 1173/13 | ERROL යනුවෙන් සඳහන් කර ඇති රන්කාසියක් | 15,625 |
| 16. | AR 1147/13 | ගාංචුව මැදින් කැඩී ඇති විකරල් සහිත රන් මාලය | 6,750 |
| 17. | A 310/13 | රන් මාලය | 14812.50 |
| 18. | 83314 | ඇසුරුම මුද්‍රා තබන යන්ත්‍රයක් | |
| 19. | A 248/13 | කහ පැහැති මිට සහිත අත් කියත් 1 | |
| 20. | 88686 | රවුම් කියත් තල 1<br>අත්කියත් 1<br>අතකොලු 1 | |
| 21. | 88687 | රවුම් කියත් 1<br>නියන් 1<br>මුලු මට්ටම් 1 | |
| 22. | 57749 | හතිල් වර්ගයේ ග්‍රයින්ඩර් 1 | |
| 23. | A 247/13 | මෝටර් රථයක වම්පස පැති කන්නාඩි 2ක් | |
| 24. | A 349/13 | MPEG 4 සිල්වර්පාට ගොබෙල් වර්ගයේ ඩීවීඩී යන්ත්‍රය<br>සීරියල් අංකය එන් ඩී වී ඩී 58008051140 | |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 25. | A 517/13 | රතුපාට කැනොන් වර්ගයේ ඩිජිටල් කැමරා 1යි |
| 26. | A 1364/13 | සොලෙක්ස් වර්ගයේ නිල්පාට වතුර මෝටරය |
| 27. | A 1883/13 | අඟල් 24 ටොෂිබා වර්ගයේ එල්ඊඩී රූපවාහිනිය |
| 28. | A 1883/13 | FUNAI වර්ගයේ ඩීවීඩී ප්ලෙයර් එක |
| 29. | AR 668/13 | ෂෙල් වර්ගයේ නිල්පාට ගෑස් සිලින්ඩර් 1 |
| 30. | AR 612/13 | නිල්පාට ගෑස් සිලින්ඩර් 1 |
| 31. | 47210 | ලාෆ් කහපාට ගෑස් සිලින්ඩර් 1 |
| 32. | A 519/13 | නිල්පාට ගෑස් සිලින්ඩර් 1 |
| 33. | AR 519/13 | සිල්වපාට කැඩී ඇති ඩීවීඩී ප්ලෙයර් 1 DAEWCOO වර්ගයේ |
| 34. | 72773 | පිලිප්ස් වර්ගයේ සිල්වපාට ඩීවීඩී යන්ත්‍රය |
| 35. | AR 612/13 | කැඩුනු ගෑස් කුකර් 1<br>එල්ජී වර්ගයේ අඟල් 21 රූපවාහිනී යන්ත්‍ර 1<br>පැනසොනික් වර්ගයේ විදුලි පන්දම් 1<br>උණුවතුර බෝතල් 1<br>ඉමිටේෂන් වළලු 2ක් තැල්ල සහිත ඉමිටේෂන් කරමාල 1 |
| 36. | B. 1069/13 | ඇලුමිනියම් ගෑස් ලිප් 1<br>ගෑස් රෙගියුලේටර් 1 |
| 37. | 58789 | පැනසොනික් වර්ගයේ කැසට් රෙකෝඩරය |
| 38. | 79782 | නොකියා වර්ගයේ කිව්ටීඩබ්ආර් දරන ජංගම දුරකථනය |
| 39. | 79781 | නොකියා වර්ගයේ 71005-2 ජංගම දුරකතනය |
| 40. | 78467 | කලුපාට නොකියා ජංගම දුරකථනය |
| 41. | A 246/13 | කලුපාට ඇල්කටෙල් ජංගම දුරකථනය ඉමී අංකය 3557344032304995 |
| 42. | A 246/13 | නොකියා ජංගම දුරකථනය ඉමී අංකය 358257/03905045 |
| 43. | A 246/13 | කලුපාට ඩොං ජංගම දුරකථනය ඉමී අංක 3558109047113059 |
| 44. | A 517/13 | සැම්සුන් වර්ගයේ කලු හා සිල්වපාට ජංගම දුරකථනය |
| 45. | A 311/13 | චයිනිස් වර්ගයේ SAETEK යනුවෙන් සඳහන් ජංගම දුරකථනය |
| 46. | 91859 | මයික්‍රො ටැක්ස් වර්ගයේ කලුපාට ජංගම දුරකථනය |
| 47. | 91230 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 48. | 94919 | කොළපාට ජංගම දුරකථනය |
| 49. | 92525 | ජංගම දුරකථනය (සෝනි එරික්සන් වර්ගයේ) |
| 50. | 95046 | සැම්සුන් වර්ගයේ කලුපාට ජංගම දුරකථනය |
| 51. | 90523 | නොකියා වර්ගයේ කලු පාට ජංගම දුරකථනය |
| 52. | A 1883/13 | නොකියා 110 ජංගම දුරකථනය ඉමී අංකය 354132055921889<br>නොකියා 206 වර්ගයේ ජංගම දුරකථනය ඉමී අංකය : 356724052269920 |
| 53. | A 314/13 | ජංගම දුරකථන බැටරි 13<br>ජංගම දුරකථන චාජර් 7 |
| 54. | A 917/13 | සෝනි එරික්සන් වර්ගයේ කැමරා ජංගම දුරකතනය |
| 55. | A 917/13 | නොකියා වර්ගයේ කැමරා ජංගම දුරකථනය |
| 56. | A 917/13 | නොකියා 2 වර්ගයේ කැමරා ජංගම දුරකථනය |
| 57. | A 917/13 | නොකියා 2 වර්ගයේ කැමරා ජංගම දුරකථනය |
| 58. | A 917/13 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 59. | A 917/13 | නොකියා වර්ගයේ කළුපාට ජංගම දුරකථනය |
| 60. | A 917/13 | නොකියා වර්ගයේ කැමරා ජංගම දුරකථනය |
| 61. | A 917/13 | කළුපාට රතුපාට සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනය |
| 62. | A 917/13 | නොකියා වර්ගයේ කලුපාට ජංගම දුරකථනය |
| 63. | A 917/13 | නොකියා වර්ගයේ කැමරා ජංගම දුරකථනය |
| 64. | A 917/13 | චයිනිස් වර්ගයේ රතු හා සුදු ජංගම දුරකථනය |
| 65. | A 917/13 | ටී. 210 බ්ලු වර්ගයේ සුදු සහ කොළ ජංගම දුරකථනය |
| 66. | A 244/13 | වර්ගය නොදත් ජංගම දුරකථනය |
| 67. | A 244/13 | ZTC වර්ගයේ ජංගම දුරකථනය |
| 68. | A 244/13 | එල්ජී කලු පාට ජංගම දුරකථනය |
| 69. | A 244/13 | FORME වර්ගයේ නිල්පාට ජංගම දුරකථනය |
| 70. | A 244/13 | ඇල්කටෙල් තැඹිලිපාට ජංගම දුරකථනය |
| 71. | A 244/13 | මයික්‍රොසෙල් වර්ගයේ ජංගම දුරකථනය |
| 72. | A 244/13 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනය |
| 73. | A 244/13 | සෝනි එරික්සන් වර්ගයේ ජංගම දුරකථනය |
| 74. | A 244/13 | සැම්සුන් කලුපාට වර්ගයේ ජංගම දුරකථනය |
| 75. | A 244/13 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 76. | A 244/13 | සෝනි එරික්සන් වර්ගයේ කැමරා ජංගම දුරකථනය |
| 77. | A 244/13 | DOC OOL වර්ගයේ ජංගම දුරකථනය |
| 78. | A 244/13 | සෝනි එරික්සන් වර්ගයේ ජංගම දුරකථනය |
| 79. | A 266/13 | අයි මොබයිල් 90 කලුපාට ජංගම දුරකථනය |
| 80. | A 266/13 | නොකියා ඊ 5 සුදුපාට ජංගම දුරකථනය |
| 81. | A 266/13 | එස්වීඑම් 600 කලුපාට ජංගම දුරකථනය |
| 82. | A 266/13 | නොකියා සී 101 මෙරූන්පාට ජංගම දුරකථනය |
| 83. | A 266/13 | සුදුපාට එස් 1000 ජංගම දුරකතනය |
| 84. | A 266/13 | චයිනීස් නොකියා ඊ 79 කලු සහ සුදු ජංගම දුරකථනය |
| 85. | A 266/13 | ෆෝන් සී එච් නිල්පාට ජංගම දුරකථනය |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | තක්සේරු මුදල රු. ශත |
|---|---|---|---|
| 86. | A 266/13 | නොකියා 2630 කලුපාට ජංගම දුරකථනය | |
| 87. | A 266/13 | ලොන්ටින් ඊ 71 කලුපාට ජංගම දුරකථනය | |
| 88. | A 266/13 | නොකියා 1202/2 කලුපාට ජංගම දුරකථනය | |
| 89. | A 266/13 | සැම්සුන් ඊ 102 නිල්පාට ජංගම දුරකථනය | |
| 90. | A 266/13 | සැම්සුන් එස් 5610 මෙරූන් පාට (බැටරි නැත) ජංගම දුරකථනය | |
| 91. | A 266/13 | කේඉසෙඩ් ජීඑන් 200 කලුපාට ජංගම දුරකථනය | |
| 92. | A 266/13 | ඊටෙල් පී 9 කලුපාට (බැටරි නැත) ජංගම දුරකථනය | |
| 93. | A 1245/12 | F 00012 අංක සහිත මවුන්ටන් පාපැදිය | 4,500 |
| 94. | A 331/13 | 1100882 ලුමාලා ස්පෝට් රතුපාට පාපැදිය | 350 |
| 95. | A 326/13 | 6340867 ලැගේජ් එක සහිත පාපැදිය | 350 |
| 96. | A 330/13 | අලුපාට කාන්තා පාපැදිය | 850 |
| 97. | A 329/13 | ෆ්රේම් කඳ මළකඩ කා ඇති කලු දුඹුරු පාපැදිය | 450 |
| 98. | A 902/13 | මඩ්ගාඩ් රහිත ස්ටන්ඩඩ් වර්ගයේ පාපැදිය | 350 |
| 99. | A 903/13 | මවුන්ටන් වර්ගයේ අංක සඳහන් නොමැති පාපැදිය | 400 |
| 100. | A 348/13 | B. M. 22657 කාන්තා පාපැදිය | 1,400 |
| 101. | A 348/13 | ස්පෝර්ට්ස් කාන්තා පාපැදිය | 1,400 |
| 102. | A 348/13 | F 33876 දරන මවුන්ටන් පාපැදිය | 2,000 |
| 103. | A 348/13 | 6 A 55751 ස්ටෑන්ඩර්ඩ් පාපැදිය | 900 |
| 104. | A 884/13 | අලුපැහැති මවුන්ටන් වර්ගයේ පාපැදිය | 600 |
| 105. | A 884/13 | නිල්පාට මවුන්ටන් වර්ගයේ පාපැදිය | 600 |
| 106. | A 884/13 | කලුපාට 905480 දරන ස්ටෑන්ඩර්ඩ් පාපැදිය | 300 |
| 107. | A 50/13 | W 86419 ඇමඩා වර්ගයේ අලුපාට කාන්තා පාපැදිය | 500 |
| 108. | A 50/13 | H Q E 08363 කාන්තා පාපැදිය | 900 |
| 109. | A 50/13 | A 750927 අලුපාට කාන්තා පාපැදිය | 450 |
| 110. | A 50/13 | 946 ඒ කලුපාට පිරිමි පාපැදිය | 400 |
| 111. | A 50/13 | S U B 27428 කලුපාට කාන්තා පාපැදිය | 1,100 |
| 112. | A 50/13 | S2J 183 කොළපාට කාන්තා පාපැදිය | 700 |
| 113. | A 50/13 | L 011753 ලුමාලා පිරිමි පාපැදිය | 1,700 |
| 114. | A 50/13 | LP 11009420 ලුමාලා කාන්තා පාපැදිය | 400 |
| 115. | A 50/13 | P 878729 හීරෝ පිරිමි පාපැදිය | 1,200 |
| 116. | A 50/13 | SPC 00905 ලුමාලා කාන්තා පාපැදිය | 900 |
| 117. | A 50/13 | L 815162 රතු සුදු කාන්තා පාපැදිය | 400 |
| 118. | අංක රහිත | LUMALA පාපැදිය | 250 |
| 119. | අංක රහිත | ALPUNE 2618 පාපැදිය | 600 |
| 120. | අංක රහිත | මවුන්ටන් රතු පාපැදිය | 2,000 |
| 121. | අංක රහිත | මවුන්ටන් දම් පාපැදිය | 600 |
| 122. | අංක රහිත | ස්ටෑන්ඩඩ් කාන්තා පාපැදිය | 4,000 |
| 123. | අංක රහිත | ලානිල්පාට පාපැදිය | 800 |
| 124. | අංක රහිත | මවුන්ටන් නිල් පාපැදිය | 800 |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | තක්සේරු මුදල රු. ශ. |
|---|---|---|---|
| 125. | අංක රහිත | මවුන්ටන් සිල්ව පාපැදිය | 900 |
| 126. | අංක රහිත | මවුන්ටන් සිල්ව පාපැදිය | 1,500 |
| 127. | අංක රහිත | කාන්තා පාපැදිය | 2,000 |
| 128. | අංක රහිත | මවුන්ටන් ඊසිරයිස් පාපැදිය | 1,300 |
| 129. | අංක රහිත | LAND GRAR මවුන්ටන් පාපැදිය | 600 |
| 130. | අංක රහිත | SPORT රතු පාපැදිය | 1,100 |
| 131. | අංක රහිත | B. M. X. සිල්වර් පාපැදිය | 700 |
| 132. | අංක රහිත | මවුන්ටන් පාපැදිය | 2,000 |
| 133. | අංක රහිත | ස්ටෑන්ඩඩ් පාපැදිය | 500 |
| 134. | අංක රහිත | මවුන්ටන් පාපැදිය | 500 |
| 135. | අංක රහිත | මවුන්ටන් පාපැදිය | 800 |
| 136. | අංක රහිත | මවුන්ටන් පාපැදිය | 400 |
| 137. | අංක රහිත | ස්ටෑන්ඩඩ් පාපැදිය | 450 |
| 138. | අංක රහිත | ස්ටෑන්ඩඩ් පාපැදිය | 400 |
| 139. | අංක රහිත | ළමා පාපැදිය | 250 |
| 140. | අංක රහිත | ස්ටෑන්ඩඩ් පාපැදිය | 150 |
| 141. | අංක රහිත | SPORT පාපැදිය | 100 |
| 142. | අංක රහිත | ස්ටෑන්ඩඩ් පාපැදිය | 100 |
| 143. | අංක රහිත | ෆෝටෝනික්ස් කැසටය | |
| 144. | අංක රහිත | අකායි ඩෙක් 1 | |
| 145. | අංක රහිත | ෂාප් වීඩියෝ කැසට් රෙකෝඩරය | |
| 146. | අංක රහිත | යුනික් රේඩියෝව | |
| 147. | අංක රහිත | නැෂනල් පැනසොනික් රේඩියෝව | |
| 148. | අංක රහිත | සැම්සුන් කොම්පියුටර් මොනිටරය | |
| 149. | අංක රහිත | පිත්තල පහනක් සීනු 2ක් | |
| 150. | අංක රහිත | ටෙක්නොකුක් ලිප් 4 උදුනක උඩ කොටස | |
| 151. | අංක රහිත | සැන්යෝ රේඩියෝ 1 | |
| 152. | අංක රහිත | පැනසොනික් කැසට් 1 බෆල් නැත | |
| 153. | අංක රහිත | ජොන්සන් කුඩා ඩෙක් යන්ත්‍රය | |
| 154. | අංක රහිත | ෆෑන් 2ක් සහිත ස්ටෑන්ඩ් 1 | |
| 155. | අංක රහිත | ගෑස් උදුනක් (පොඩි තනි ලිපක්) | |
| 156. | අංක රහිත | රතුපාට ගිනි නිවන උපකරණය | |
| 157. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටිය | |
| 158. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටිය | |
| 159. | අංක රහිත | වාහන ලයිට් 2 | |
| 160. | අංක රහිත | බ්රේක්ලයිනර් 4 | |
| 161. | අංක රහිත | කොයිල් 1 | |
| 162. | අංක රහිත | කලු කොම්පියුටර් කීබෝඩ් 1 | |
| 163. | අංක රහිත | පිඟන් 6 පළඟනා 3 | |
| 164. | අංක රහිත | සැම්සුන් කැසටයක කොටසක් | |
| 165. | අංක රහිත | සරනේරු ටැප් දොර ලොක් තරාදියක් | |
| 166. | අංක රහිත | වීදුරු කීපයක් බෙඩ්සීට් විදුලි කේතලය ප්ලාස්ටික් පෙට්ටි අයන් එකක් රිකෝන් ඉස්කුරුප්පු නියන් සෙට් 1 ලොකු මල් නියන් 1 පීර 1 පිහියා 1 කැඩුනු ඔරලෝසුව ඇලුමිනියම් වළං කීපයක් | |
| 167. | අංක රහිත | ත්‍රිවිල් ලයිට් 6 | |
| 168. | අංක රහිත | ඔරලෝසුව | |

| අනු අංකය | නඩු අංකය | විස්තරය | තක්සේරු මුදල |
|---|---|---|---|
| 169. | අංක රහිත | සාරි 12 අඩංගු බෑගය | |
| 170. | අංක රහිත | ඩේට්‍රෝන් ටී වී 1 | |
| 171. | අංක රහිත | යකඩ බට අඩංගු කවරය | |
| 172. | අංක රහිත | තඹ කම්බි රෝල් 1 | |
| 173. | අංක රහිත | සපත්තු 8ක් අඩංගු බෑගය | |
| 174. | අංක රහිත | ඩෙනිම් රෝල් 1 | |
| 175. | අංක රහිත | පීරිසි සහ කෝප්ප සමග ටී පොට් 1 | |
| 176. | අංක රහිත | තරාදිය සහ තැටිය | |
| 177. | අංක රහිත | වාහන ඇක්සල් 1 | |
| 178. | අංක රහිත | ගිනි නිවන උපකරණය කලු | |
| 179. | අංක රහිත | සාස්පාන් 3 අයන් 1 හීටර් 1 | |
| 180. | අංක රහිත | නියන් 1 පාපිසි 1 | |
| 181. | අංක රහිත | තාච්චි 2 | |
| 182. | අංක රහිත | වේග පාලන යන්ත්‍රය | |
| 183. | අංක රහිත | වයර් අඩංගු කලු ගමන් බෑගය | |
| 184. | අංක රහිත | ඩෙනිම් කලිසම් උරය | |
| 185. | අංක රහිත | රෝද 2 | |
| 186. | | ඡායා පිටපත් යන්ත්‍ර 1 | |
| 187. | | යතුරුලියනය 7482796 | |
| 188. | | යතුරුලියනය 965067 | |
| 189. | | යතුරු ලියනය 575124 | |
| 190. | | පරිගණක 1 | |
| 191. | | පරිගණක මොනිටර් 1 | |
| 192. | | යූ. පී. එස්. යන්ත්‍රය 02 | |
| 193. | | අල්මාරි 1 | |
| 194. | | අල්මාරි වානේ 06 | |
| 195. | | ලාච්චු 04 කැබිනට් 01 | |
| 196. | | ලාච්චු 03 කැබිනට් වානේ 01 | |
| 197. | | බිත්ති ඔරලෝසු 01 | |
| 198. | 84044 | බඩි වර්ගයේ තරාදි 1 | |
| 199. | 84044 | පිහියා 2ක් සුදුපාට බකට් 2 | |
| 200. | 85825 | සැල්වා වර්ගයේ දුනු තරාදි 1 | |
| 201. | 85825 | මන්නා පිහි 1 | |
| 202. | 83314 | සවල් 2 | |
| 203. | 88570 | සවල් 1 | |
| 204. | ඒ. 669/13 | සවල් 2 | |
| 205. | 84490 | සවල් 5 | |
| 206. | 84490 | බාල්දි 4 | |
| 207. | 87268 | යකඩ බැරල් 1 | |
| 208. | 83372 | යකඩ බැරල් 15 | |
| 209. | 83539 | යකඩ බැරල් 21 | |
| 210. | අංක රහිත | හිස් වීදුරු බෝතල් තොගයක් | |
| 211. | අංක රහිත | හිස් කෑන් තොගයක් | |
| 212. | අංක රහිත | හිස් බැරල් තොගයක් | |
| 213. | අංක රහිත | තඹ දඟර තොගයක් | |
| 214. | අංක රහිත | ගෙවී ගිය ටයර් 04ක් | |

08-10

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015 වර්ෂය

2015 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට යටත් 2014 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 10.30 දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිලදී ගැනීම සඳහා ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය ද, ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහා ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2014 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාදය මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප.ව. 3.00 ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2015 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2015 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව, ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ද ලබාගත යුතු ය.

08. 2014 සැප්තැම්බර් මස 03 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2014 ඔක්තෝබර් මස 24 වැනි දින පෙ.ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. ඒ. ආර්. සුදර්ශණී,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2014 ජූලි මස 09 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *රා තැබෑරුම විවෘත කර තබන වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | නාරම්මල | 2014.09.03 පෙ.ව. 10.30 ට පෙර | 1,000 | පෙ.ව. 11.00 - ප.ව. 2.00 දක්වා<br>ප.ව. 5.00 -ප.ව. 8.00 දක්වා |

08-32

---

**2015 වර්ෂය සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2015 ජනවාරි මස 01 සිට 2015 දෙසැම්බර් මස 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා, 1982 අගෝස්තු මස 20 වැනි දින නිකුත් කරන ලද, අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද, රා විකිණීමේ කොන්දේසිවලට ද, යටත්ව 2014 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ. ව. 10.30 දක්වා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. රා රේන්ද මිල දී ගැනීමට ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර, මෙහි පහත දැක්වෙන ටෙන්ඩර් උපලේඛනයෙන් නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශාඛාවකින් ලබාගත් කුවිතාන්සියක් ද, ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි, ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව කවරයක බහා, එයට මුද්‍රා තබා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද, පැහැදිලිව ලියා, උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැකිය.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2014.09.01 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි පෙනී සිටිය යුතු ය.

5. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර්පත්‍ර සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් සතු වේ.

6. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, සාර්ථක ටෙන්ඩර්කරුවකු විසින් එසේ ප්‍රකාශ කළ දින ප. ව. 2.00 ට පෙර පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

7. 2014 වර්ෂය සඳහා මෙතෙක් රා තැබෑරුම පැවති ස්ථානය ලබා දීමට සහතිකවනු නොලැබේ. එම ගොඩනැගිල්ල නොලැබෙන්නේ නම්, ඒ වෙනුවට තෝරා ගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතු ය.

8. 2014.09.01 දින රේන්ද විකිණීමේ දී සතුටුදායක ඉල්ලීම් නොලැබුනහොත් 2014.10.22 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මෙම කාර්යාලයේ දී පවත්වනු ලැබේ.

9. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

2014 ජූලි මස 09 වැනි දින,
පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2015 වර්ෂය**

| *අංකය හා නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් වසන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. ගිරිඋල්ල | කටුගම්පල හත්පත්තුව | මාහරගම/හාල්පනේගම තුළ (අංක 1566 මාහරගම ග්‍රාම නිලධාරි වසම) | 1,000 | 2015.09.01 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 සහ ප.ව. 5.00 | ප. ව. 2.00 සහ ප.ව . 8.00 |

08-07

---

**2015 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2015 ජනවාරි 01 වැනි දින සිට 2015 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිළ දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2014.08.20 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් බාරගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත් අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය වන 2014.08.20 වැනි දින පෙ.ව. 10.30 ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2014.10.20 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස 02 මුදල් කොටසකට වැඩි කොටසකට ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2014 ජූලි මස 10 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*2015 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තු - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2015.01.01 වැනි දින සිට 2015.12.31 වැනි දින දක්වා*

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත්* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවිකුඹුර වත්ත | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2014.08.20 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2014 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍ර අළුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2014.08.20 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතුය.

08-33

# රජයේ නොවන දැන්වීම්

**වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

| | *සමාගමේ නම* | *සමාගමේ අංකය* | *ලියාපදිංචි කාර්යාලය* |
|---|---|---|---|
| 1. | හොලිඩේ පාර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 79633 | අංක 105 1/1, හිල් ස්ට්‍රීට්, දෙහිවල |
| 2. | ජුවෙල් ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 82611 | අංක 121/10, සී ස්ට්‍රීට්, කොළඹ 11 |
| 3. | ඒ. එම්. ඒ. හෝල්ඩින්ස් (පී වී ටී) ලිමිටඩ් | පී වී 71475 | අංක 237/76, පොල්හේන්ගොඩ පාර, කොළඹ 06. |

එම්. සී. එම්. නවාස්,
සමාගම් ලේකම්.

08-59

## දැන්වීමයි

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

නම : සුමනතිලක කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97442
ලියාපදිංචි කළ දිනය : 2014.03.07
ලියාපදිංචි කාර්යාලය : අංක 31/2, කඳවල පාර, රත්මලාන.

තෙනහන්දි දිල්රුක්ෂි චන්දෝදනී ද සිල්වා,
සමාගම් ලේකම්.

08-22

---

## ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : සයුරි කල්දේරා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 93593
සංස්ථාගත කළ දිනය : 2013 ජූලි 16 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 215, උඩුමුල්ල, මුල්ලේරියාව, නව නගරය.

සමාගම් අධ්‍යක්ෂක.

08-56

---

## ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ආර්. බී. ඩී. එන්ටප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 93449
සංස්ථාගත කළ දිනය : 2013 ජූලි 09 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 125/2, මාලිගාගොඩැල්ල, උඩුමුල්ල, මුල්ලේරියාව, නව නගරය.

සමාගම් අධ්‍යක්ෂක.

08-57

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ආනන්දඩ්‍රාමා
සමාගමේ අංකය : ජී ඒ 2940
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස්( ප්‍රයිවට) ලිමිටඩ්
පීවී 5958.

08-67

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) වගන්තිය යටතේ සී/ස කොයාඩ් ලංකා (පෞද්.) සමාගම ස්වෙච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා පවත්වන ලද විශේෂ රැස්වීමේ යෝජනා සම්මතය.

*සමාගම් අංකය :* N (PVS) 20589

වර්ෂ 2008ක් වූ අගෝස්තු මස 21 වැනි දින,
532/2 සුදුවැල්ල, වෙන්නප්පුව යන ස්ථානයේදී ය.

*සහභාගීත්වය :*

අරුණ කුමාර ජයසිංහ,
සිංඤෝර තුප්පහිගේ ප්‍රෙමිලා ක්‍රිෂාන්ති කොස්තා
කුරණගේ ෆීලික්ස් ජෝන් මැක්ඩොනල් පෙරේරා
හෙට්ටිතන්ත්‍රීගේ නිශාන්ති දිල්රුක්ෂි ජෙනිටා පෙරේරා

ඉහත සීමාසහිත කොයාඩ් ලංකා පෞද්ගලික සමාගමේ කොටස් හිමියන් /අධ්‍යක්ෂකවරුන් වන අප අදාළ සමාගම තවදුරටත් පවත්වාගෙන යාමේ හැකියාව නොමැති වීමේ හේතුවෙන් අද දින සිට 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) වගන්තිය ප්‍රකාරව ස්වෙච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලද හෙයින් ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට තීරණය කරන ලදී.

*නම :*

1. අරුණ කුමාර ජයසිංහ (කොටස් හිමි) 5%,
2. සිංඤෝර තුප්පහිගේ ප්‍රෙමිලා ක්‍රිෂාන්ති කොස්තා (කොටස් හිමි/අධ්‍යක්ෂිකා) 5%,
3. කුරණගේ ෆීලික්ස් ජෝන් මැක්ඩොනල් පෙරේරා (කොටස් හිමි) 65%,
4. හෙට්ටිතන්ත්‍රීගේ නිශාන්ති දිල්රුක්ෂි ජෙනිටා පෙරේරා (කොටස් හිමි/අධ්‍යක්ෂිකා) 25%.

08-69

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : බෙලියෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98358
ලියාපදිංචි කාර්යාලය : අංක 542/ A, මීගමුව පාර, මහබාගේ
ලියාපදිංචි කළ දිනය : 2014 අප්‍රේල් මස 30 වැනි දින.

සමාගමේ ලේකම්වරු.

08-104

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ලිෂ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99434
ලියාපදිංචි කාර්යාලය : අංක 65, මීගහවත්ත, සියඹලාපේ (බ. ප.)
ලියාපදිංචි කළ දිනය : 2014 ජූලි මස 01 වැනි දින.

සමාගමේ ලේකම්වරු.

08-105

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ කෙරෙන සමාගම් නම් වෙනස් කිරීම පිළිබඳ නිවේදනය.

සමාගමේ නම : එල්. ඕ. එල්. සී. ලයිෆ් ඉන්ෂුවර්න්ස් ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී බී 4824
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය,
සමාගමේ නව නම : එල්. ඕ. එල්. සී. ඉන්ෂුවර්න්ස් හෝල්ඩිං කම්පැණි ලිමිටඩ්.

එල්. ඕ. එල්. සී. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

2014 ජූලි මස 09 වැනි දින.

08-110

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම් 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ට්‍රේඩ්එක්සෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2014.07.08
3. සමාගමේ අංකය : පී වී 99573
4. ලියාපදිංචි ලිපිනය : අංක 17, දෙවැනි පටුමග, කව්ඩාන බ්‍රෝඩ්වේ, දෙහිවල.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

08-112

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාගත කරන ලද බව මෙයින් දන්වමි.

නම : ඉයුට්‍රිමා ජැපොනිකා ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 99488
සංස්ථාගත කළ දිනය : 2014 ජූලි 4 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 19 ඒ, හවර් වීදිය, කොළඹ 05.

අධ්‍යක්ෂ.

08-113

---

## දැන්වීමයි

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : නේචර්ස් එන්ඩෝව්මන්ට්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගමේ අංකය : පී වී 98750
ලියාපදිංචි කාර්යාලය : අංක 21, නිතුලේතැන්න, කුණ්ඩසාලේ.

ඉහත කී සමාගම වෙනුවෙන්,

හේෂලා සෙනවිරත්න,
සමාගම් ලේකම්.

08-114

---

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පන්නිපිටිය, රුක්මල්ගම, අංක 13ඒ/145 පදිංචි වැලිකඩ ලියනආරච්චිගේ ජුත් තෙරෙසා පෙරේරා (ජා. හැ. අංකය 666530535 වී) වන මා විසින් මීගමුව, පිටිපන, අංක 715/1 පදිංචි කාසී ලියනගේ ගේබ්‍රියල් ටයිටස් ප්‍රනාන්දු (ජා. හැ. අංක 430372394 වී) යන අය වෙත පවරන ලද 2003 සැප්. 19 දිනැති සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය 2014 ජූලි මස 8 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කල බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙයි.

වැලිකඩ ලියනආරච්චිලාගේ ජුත් තෙරෙසා පෙරේරා.

අංක 13/145, රුක්මල්ගම,
පන්නිපිටිය.

08-119

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බණ්ඩාරගම වීදාගම මෛත්‍රී පාර අංක 191 හි පදිංචි සට්ටම්බි රාලලාගේ කාන්ති අශෝකා සෙලින් පෙරේරා වන මා වෙත රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තනාපති ඩී. ඇම්. පෙරේරා මහතා ඉදිරියේ අත්සන් කොට 2012.11.19 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් බණ්ඩාරගම වීදාගම මෛත්‍රී පාර අංක 191 හි පදිංචි දැනට රෝමයේ සේවයේ නියුතු ජානක සඳරුවන් විනෝදහේවා යන අය විසින් ලබා දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කර නිශ්ප්‍රභාකර ශුන්‍ය කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙමු.

මින් ඉදිරියට එකී අපගේ ඇටෝර්නි බලපත්‍රය මත ඇටෝර්නි බලකාරයා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ එළඹෙනු ලබන ගිවිසුමකට හෝ අත්සන් කරනු ලබන ඔප්පුවකට කිසිදු වගකීමක් දරන්නේ නැති බව ද වලංගු භාවයක් නැති බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

සට්ටම්බි රාලලාගේ කාන්ති අශෝකා සෙලින් පෙරේරා.
ජා. හැ. අංක 566970325 වී.

2014 ජූලි මස 16 වැනි දින.

08-120

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2008.10.08 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඩී ප්ලාස්ටික්ස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 65820
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 96/1, "මැණික්" උස්වැටකෙයියාව.

සමාගම් ලේකම්.

08-128

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගම් නාමය : කියු - ප්‍රෝ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 99308
ලියාපදිංචි ලිපිනය : අංක 04, බොතෝජු පටුමග, දුම්රියපල පාර, දෙහිවල.

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

08-129

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 ජූලි මස 8 වැනි දින ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම : ඩෙල්මේජ් ඒවියේෂන් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 99520
ලියාපදිංචි ලිපිනය : අංක 101, විනයාලංකාර මාවත, කොළඹ 10

සමාගම් ලේකම්.

08-142

## නිවේදනය

2007 අංක 07 සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත දැක්වෙන සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නාමය : ඉන්ටර්නැෂනල් ටැලන්ට් ඩිවලොප්මන්ට් ඉන්ස්ටිටියුට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 66379
සංස්ථාගත කළ දිනය : 2008 දෙසැම්බර් මස 01 වැනි දින
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 16, ශ්‍රී ධර්මකීර්තියාරාමපාර, කොළඹ 03
සමාගමේ ලේකම් : ෂනිල් ප්‍රනාන්දු (ඇන්ටන් ප්‍රනාන්දු ඇසෝසියේට්ස්) ලේකම් අංක : 2002/124.

08-143

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන වෙළඳ සමාගම් ආඥා පනතේ 9 (1) ජේදය අනුව මෙයින් දන්වා සිටින වග නම්,

වෙළඳ සමාගමේ නම : එමොජොට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 99595
සංස්ථාගත කළ දිනය : 2014 ජූලි 09
ලියාපදිංචි කාර්යාලය : අංක 8/2 කැපිටල් රෙසිඩන්සීස්, අංක 65, ධර්මපාල මාවත, කොළඹ 07.

අධ්‍යක්ෂක.

08-144

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල, දෙහිමඩුව, වේරගල පාර, අංක 48/2 හි පදිංචි අංක 555443579 වී දරන ජාතික හැඳුනුම්පත හිමි අලවතුගොඩගේ සුමනා පියසීලි වන මම, කමණී කුමාරි මේසසූරිය ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කළ අංක 2839 සහ 2012.11.14 දාතම විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 627613598 වී දරන ජාතික හැඳුනුම්පත හිමි මාවනැල්ල, කප්පාගොඩ තුන්වන පටුමගෙහි පදිංචි අලවතුගොඩගේ සුනන්දා චන්ද්‍රසීලි යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙස පත්කොටගත් අතර එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ඇයගේ වැසියන්ටත් මෙයින් දැනුම් දෙමි.

අලවතුගොඩගේ සුමනා පියසීලි.

08-148

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව දැනුම් දීමයි.

සමාගමෙහි නාමය : බ්‍රීත් ෆ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී වී 99128
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2014 ජූනි මස 16 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-155

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව දැනුම් දීමයි.

සමාගමෙහි නාමය : ඊටැලියන් ෆුඩ් ඇන්ඩ් බෙවරේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී වී 99095
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2014 ජුනි මස 13 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-156

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමෙහි නාමය : එම්. එස්. ඒ. සම්සුඩීන් ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී වී 99352
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 15/1, බීච් රෝඩ්, ගල්කිස්ස
සංස්ථාපිත දිනය : 2014 ජුනි මස 27 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-157

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව දැනුම් දීමයි.

සමාගමෙහි නාමය : ඊටැලියන් ගෝමේට් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී වී 99006
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2014 ජුනි මස 09 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-158

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ මෙසේ නිවේදනය කරනු ලැබේ.

පින්ක් ඇන්ඩ් යූ ක්ලීනිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, පී වී 86221, ලිපිනය : නාවල, කොස්වත්ත පාරේ, අංක 31/4, 4 වැනි පටුමග ලෙස ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ.

08-167

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : මෙට්‍රොපොලිටන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99428
සංස්ථාගත කිරීමේ දිනය : 2014.07.01
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 85, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02.

මෙට්‍රොපොලිටන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කොර්පරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2014 ජූලි මස 03 වැනි දින.

08-171

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ පදිංචි එම්. එච්. ඒ. වික්‍රමරත්න තිසේරා ප්‍රසිද්ධ නොතාරිස්තැන ඉදිරිපිට දී 2007 පෙබරවාරි මස 03 වැනි දින ලියා සහතික කළ ඇටෝර්නි බලපත්‍රය මඟින් අංක 612/7, මීගමු පාර, මාබෝල, වත්තල හි පදිංචි රවෙල් නිරෝලි ඔබේසේකර වන මා විසින් අංක 612/7, මීගමු පාර, මාබෝල, වත්තල හි පදිංචි නුගේගොඩගේ දෝන ලලනා රණසිංහ යන අය වෙත පවරා දෙන ලද ඇටෝර්නි බලතල සියලුම ගනුදෙනු සතුටුදායක ලෙස සම්පූර්ණ කළ බැවින්, මෙයින් අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත දන්වා සිටිමි.

රවෙල් නිරෝලි ඔබේසේකර.

08-181

## නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : රණවීර ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99626
ලියාපදිංචි ලිපිනය : අංක 313/3 හුඹුටියාව, නිට්ටඹුව
සංස්ථාගත කිරීමේ දිනය : 2014 ජූලි මස 10 වැනි දින

ඉදිරිපත් කිරීම,

සමාගම් අධ්‍යක්ෂ.

08-200

---

## බීරා සින්තටික් ෆයිබර් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය පී වී 2153

**සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම**

2014 ජූලි මස 11 වැනි දින සමාගමේ පැවැති විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) ( (b) වගන්තිය යටතේ මෙම සමාගම 2014 ජූලි මස 11 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

වී. සෙල්වරාජ්,
බී. ඩී. පී. ඩී. පෙරේරා,
කේ. ඒ. අමරසිංහ,
අධ්‍යක්ෂවරු.

2014 ජූලි මස 16 වැනි දින.

08-180/1

---

## බීරා සින්තටික් ෆයිබර් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය පී වී 2153

**2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සමාගමේ ඇවරකරු පත්කිරීමේ දැන්වීම**

කොළඹ 04. කාසල් පටුමගේ අංක 02 හි හතරවැනි මහලෙහි පදිංචි ජී. ජේ. ඩේවිඩ් වන මම 2014 ජූලි මස 11 වැනි දින කොළඹ 02, පාක් වීදිය, අංක 48, පාක්වේ ගොඩනැගිල්ල, තුන්වැනි මහල දරන ස්ථානයේ පිහිටි බීරා සින්තටික් ෆයිබර් (ප්‍රයිවට්) ලිමිටඩ් හි පැවැති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම සමාගමේ ඇවරකරු වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. ජේ. ඩේවිඩ්,
ඇවරකරු,
බීරා සින්තටික් ෆයිබර් (ප්‍රයිවට්) ලිමිටඩ්.

එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත හා ආයතනික අයකර ගැනීම්,
හතරවැනි මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.
2014 ජූලි මස 16 වැනි දින.

08-180/2

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 : 1 වගන්තියේ විධිවිධාන යටතේ දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඩී එන් එස් හෝල්ඩිංග්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99399
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 772, කොළඹ පාර, කුරණ, මීගමුව.

වික්‍රමසිංහ ආරච්චිගේ තුෂාරි ගංගා ලිවේරා,
සමාගම් ලේකම්.

08-212

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

| *සමාගමේ නම* | *සමාගම ලියාපදිංචි අංකය* | *සමාගම ලියාපදිංචි කළ කාර්යාලය* | *සමාගම ලියාපදිංචි කළ දිනය* |
|---|---|---|---|
| සැවොන්මාර්ක් ප්ලාස්ටික් (පීවීටී) එල්ටීඩී | පී. වී. 99394 | අංක 93, පරණ ගාලු පාර, වලාන, පානදුර | 2014.06.30 |
| සරසි එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී | පී. වී. 99470 | අංක 316/1, අවිස්සාවේල්ල පාර, නවගහවෙල, මුල්ලේරියාව, නව නගරය | 2014.07.03 |

ආර්. කේ. එල්. එස්. කොපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී,
සමාගම් ලේකම්වරු.

08-197

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

| *සමාගමේ නම* | *සමාගම ලියාපදිංචි අංකය* | *සමාගම ලියාපදිංචි කළ කාර්යාලය* | *සමාගම ලියාපදිංචි කළ දිනය* |
|---|---|---|---|
| කැන්රෙන් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 99489 | අංක 34, ගොරකගහ ඇවනිවු, හැව්ලොක් පාර, කොළඹ 06 | 2014.07.03 |
| මාස් ඉංජිනියරිං ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 64919 | අංක 461/ඊ, ෂර්වුඩ් ග්ලේඩ්, අරංගල, හෝකන්දර | 2008.07.23 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

08-198

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *සමාගමේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|
| ටී චීෆ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98452 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| ඇම්ජෝ බීච් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98983 | සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| එම් ජේ ස්විෆ්ට් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99040 | සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| ස්විෆ්ට් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99168 | සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| ගුඩ් විව් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99198 | අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| බෝල්ඩ්‍රික් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99222 | සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| එලයිඩ් සිස්ටම්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99385 | අංක 62, බොරාල පාර, වැලිගම |
| කොවබන්ගා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99551 | සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |

සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05.

08-159

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

අමිල ඔටෝ එන්ටප්‍රයිසස්.
ගිණුම් අංක : 0017 1000 9399.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 මැයි මස 29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හාර කෝටි අනූ එක් ලක්ෂ හතලිස් හතර දහස් අටසිය අනූවයි ශත අසූවක (රු. 49,144,890.80) මුදල ද, 2014 මැයි 21 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි හතලිස් හය ලක්ෂ අසූ දහසක (රු. 44,680,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහක් (15.5%) හා තවත් රුපියල් දහ හතර ලක්ෂ තිස් එක් දහස් නමසිය විසි නමයයි ශත හැට නමයක (රු. 1,431,929.69) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%)ක් බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.07.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2014.06.30 වැනි දින "දිවයින" සහ "තිනකුරල් " සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2014.08.26 වැනි දින 4158 A දරන පිඹුරේ ලොට් A පෙ. ව. 10.30 ට සහ 4158 A දරන පිඹුරේ ලොට් B පෙ. ව. 10.45 ට පිහිටි ස්ථානයන්හි දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ කරගම්පිටිය පිහිටි "දෙල්ගහවත්ත සහ හේවගේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2002 දෙසැම්බර් මස 16 දාතම හා අංක 4158 A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් A නැගෙනහිරට : කරගම්පිටිය හරස් පාර, දකුණට : ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත වරිපනම් අංක 160/1 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : බලයලත් මානක තැන වී. සිවසුන්දරම් යන අය විසින් සාදන ලද අංක 697 දරන පිඹුරේ ලොට් 1 සහ අඩි පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම බිංදුවයි හතක් (අ. 0, රූ. 0, පර්. 19.07) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4158 A දරන පිඹුරට අනුව ය.

අංක 4158 A දරන එකී පිඹුරේ එකී ලොට් B මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කරගම්පිටිය පිහිටි "දෙල්ගහවත්ත සහ හේවගේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී.බී දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2002 දෙසැම්බර් මස 16 දාතම හා අංක 4158 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් A නැගෙනහිරට: කරගම්පිටිය හරස්පාර, දකුණට : ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත වරිපනම් අංක 160/1 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : අඩි පාර සහ බලයලත් මානක තැන වී. සිවසුන්දරම් යන අය විසින් සාදන ලද අංක 697 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 22.10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4158 දරන පිඹුරට අනුව වෙලුම/පත්‍රිරුව F 05/283 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 1449 ප්‍රකාර ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ කරගම්පිටිය පිහිටි "දෙල්ගහවත්ත සහ හේවගේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2002 දෙසැම්බර් මස 16 දාතම හා අංක 4158 A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත නැගෙනහිරට : කරගම්පිටිය හරස් පාර, දකුණට : ලොට් B සහ බස්නාහිරට: අඩි පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 22.20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4158 A දරන පිඹුරට අනුව වෙලුම/පත්‍රිරුව එෆ් 05/281 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 1451 ප්‍රකාර සහ ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

08-194/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඇන්තන් ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0009 1000 5669.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.01.24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන් කෝටි තිස්එක් ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය පනස් පහයි ශත පනස් හතරක (රු. 53,153,355.54) මුදල ද, 2012 නොවැම්බර් මස 08 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි අනූනම ලක්ෂ අනූනම දහස් නමසිය හතලිස් දෙකයි ශත හැට තුනක (රු. 49,999,942.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපල සහ පරිශ්‍රයන් 2013.03.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2013.02.18 වැනි දින "දිවයින" සහ "තිනකුරල් " සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2014.08.25 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාවන් තුළ දකුණු කොච්චිකඩේ වෝඩ් අංක 19 පිහිටි පරණ යොන් වීදිය වරිපනම් අංක 193 (කොටසක්) දරන බලයලත් මානක තැන එස්. එච්. බී. ජෝශප් යන අය විසින් සාදන ලද 1984 දෙසැම්බර් මස 11 දාතම හා අංක 62/84 දරන පිඹුරේ නිරූපිත ඉඩම් කොටසේ උප බෙදුමක් සහ නැවත මිනුමක් වන ඉඩමට බලයලත් මානක තැන පී. සින්නතම්බි යන අය විසින් සාදන ලද 1994 නොවැම්බර් මස 07 දාතම හා අංක 4746 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් එක්ස් වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අලුත් යොන් වීදිය වරිපනම් අංක 216 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : මෙහි ලොට් වයි දකුණට : පරණ යෝන් වීදිය සහ බස්නාහිරට : පරණ යෝන් වීදිය වරිපනම් අංක 189 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම පහයි හයක් (අ. 0 රූ. 0ප ර්. 9.56) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4746 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ඒ/1116/228 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-194/2

---

## හැටන් නැෂනල් බැංකුව පී එල් සී - මාදම්පේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසිය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ බටහිර කුලියාපිටිය මහලේකම් කාර්යාලයේ බෙමිණිගල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මැද්දේකැටිය කෝරළේ කටුගම්පල හත්පත්තුවේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ බෙමිණිගල්ල ගමේ පිහිටි ලෝලුවගොඩහේන්යාය නමැති ඉඩමේ පිඹුරු අංක 2013/83 පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද 2013.03.18 දාතම හා අංක 2013/83 දරන පිඹුරෙන් නිරූපිත ලොට් 2ඒ වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ප්‍රමාණයෙන් අක්. 10 රූඩ් 0 පර්චස් 21.7.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය.-* කුලියාපිටිය නගරයේ සිට කුරුණෑගල ප්‍රධාන පාරේ කි. මී. 8 1/2ක් පැමිණි විට උණලීය හංදියේ පිහිටි 31 වැනි සැතපුම් කණුව හමුවේ. එම හන්දියෙන් වමට හැරී අණුක්කන පාරට පිවිස (තාර පාර) කි. මී. 2.2 පැමිණිවිට සිරිමාපුර හන්දිය හමුවේ. එතැනින් දකුණට හැරී අඩක් තාර දැමූ හා බොරළු දැමූ පාරට පිවිස තවත් කි. මී. 1 3/4 ක් පැමිණි විට පාර වම්පස පිහිටි මෙම දේපළ හමුවේ.

ඒ. ගාමිණී ද සිල්වා සහ ඒ. ජේ. හර්ෂණී ද සිල්වා යන අයට ලබාදුන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැඳුම්කරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංකුව පී එල් සී වෙත උකස් කරන ලද දේපළ 2014 අගෝස්තු මස 27 වැනි බදාදා පෙ. ව. 11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014 ජුනි 06 වැනිදා රජයේ *ගැසට් පත්‍රය* ද, 2014 ජුනි 11 වැනිදා ඩේලිමිරර්, ලක්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල .-*

සාර්ථක ගැනුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%(සියයට එක) දේශීය විකිණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාල වේ නම් ඒවාද සමග වෙන්දේසි දින 30ක් ඇතුළත ගෙවිය යුතුවේ.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපි ලේඛන කොළඹ ටී. බී ජයා මාවත, අංක 479 හැටන් නැෂනල් බැංකුව පී එල් සී සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂාකර බැලිය හැකිය.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස් දුටුගැමුණු වීදියෙන් හැරී,
කොහුවල.
දුරකථන අංක 011- 4302622 011- 4302623
ෆැක්ස් අංකය : 2856013.

08-191

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාවට නංවමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය

මීගමුව ප්‍රනාන්දු මාවතේ, අංක 24-26 දරන ස්ථානයේ "මීගමුව ශාඛාව" යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තාවූ කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී

............................පැමිණිලිකරු

නඩු අංකය : HC Civil 353/2009

එදිරිව

ජාඇල, උදම්මිට අංක 49 දරන ස්ථානයේ පදිංචි සහ කඳාන, නාගොඩ, මීගමුව පාරේ අංක 304 දරන ස්ථානයේ "රෝහිෂා ටෙක් සිටි" යන නාමය හා විලාසය යටතේ ව්‍යාපාරයෙහි යෙදී සිටින මහමාලගේ ජ්ලැසිඩස් අර්ල් රෝහිත පෙරේරා.

.............................විත්තිකරු

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2010 ක් වූ ජූලි මස 16 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුලත් කරන ලද ඒකපාක්ෂික තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම්කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට

(අ) රු. 4,000,000 ක මුදලක් සහ ඒ මත 2008ක් වූ දෙසැම්බර් මස 26 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 36% බැගින් පොළිය ද,

(ආ) අධිකරණයේ නිළධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද අයකර දෙන ලෙස ආඥා කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තවද, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට ද වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2010ක් වූ ජූලි මස 16 වැනි දින කොළඹ වාණිජ මහාධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ

උදම්මිට ජාඇල යන ස්ථානයේදී වර්ෂ 2014ක් වූ අගෝස්තු මස 25 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ උදම්මිට පිහිටි දවටගහවත්තේ කොටසක් යනුවෙන් හැඳින්වුණු එම සම්පූර්ණ ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. එකී ඉඩමට මායිම් උතුරට : අරුමාදුර එව්ජින් ද සිල්වා කුලසිංහගේ සහ අනිකුත් අයගේ ඉඩම වෙන් කරන පැළඉනි වැට ද නැගෙනහිරට : ලත්වාහන්දි ජෝන් සිල්වාගේ සහ අනිකුත් අයගේ ඉඩම වෙන් කරන පැලඉණි වැට ද, දකුණට : ලියනදුර ලපෝහාමි සිල්වාට අයත් එම ඉඩමේ ම කොටස වෙන් කරන පැළ ඉණි වැට ද බස්නාහිරට : වෙද පුංචි නෝනා සිල්වාගේ ඉඩම වෙන් කරන පැළ ඉණි වැට සහ එහි ප්‍රමාණය රූඩ් එකක් (අ. 0 රූ. 1 පර්. 0) ක් වේ. මෙය බී 195/166 හි ලියාපදිංචි කර ඇත.

මෑත පිඹුරක් අනුව මෙය පහත සඳහන් පරිදි විස්තර කර ඇතඃ-

ඉහතකී දවටගහවත්තේ 1 ඒ 1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති එම සම්පූර්ණ ඉඩම බලයලත් මිනින්දෝරු තැන්පත් කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද අංක 4628 සහ 2007.03.27 වැනි දින දරන සැලැස්ම අනුව ඊට මායිම් උතුරට : කලින් එච් ග්‍රේනියර් සිල්වාට අයත් වත්ත සහ දැන් ගිනැන්ස් වත්ත සහ එච් ග්‍රේනියර් සිල්වාගේ ඉඩම ද, නැගෙනහිරට : එච්. ග්‍රේනියර් සිල්වාගේ යූ. ප්‍රේමරත්න සිල්වාගේ ඉඩම අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් වූ බිම් කොටස සහ එවිරින් ගුණසේකරගේ ඉඩම ද, දකුණට : එදෝරිස් සිල්වාගේ ඉඩමද, සහ බස්නාහිරට : එම් ධර්මසිරි සිල්වාගේ ඉඩම සහ එහි ප්‍රමාණය රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම එකයි නවයක් (අ. 0 රූ. 1 පර්. 0.19)ක් වේ. එකී සැලැස්මේ නිරූපිත මාර්ගය මත මාර්ග අයිතිය සහිතවයි.

*ඉඩමට පිවිසීම.*- කොළඹ සිට කොළඹ -මීගමුව පාරේ ගොස් දඬුගම පාලමට මීටර් 10ක් පමණ මෙහායින් (එනම් දඬුගම පාලම පෙනෙන දුරින්) දකුණු පසින් උදම්මිට පාර හමුවේ. එම පාරේ රේල් පාර ද, පසුකර මීටර් 750ක් පමණ ගියවිට තුංමන් හංදියක් හමුවේ. එම හංදියේ අශෝකාරාම පාර යනුවෙන් පුවරුවක් ද දකුණු පසින් යොදා ඇත. එයින් වම්පසට ඇති පාරේ මීටර් 500ක් පමණ ගිය විට අදාළ දේපළ වෙත පිවිසීම සඳහා ඇති අඩි 12 පාරේ අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%),
02. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තු රු. 10,500,
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
05. රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු,
06. ලිපිකරු බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30ක් ඇතුළත දී බස්නාහිර පළාත්බද කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු යි.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්
වාණිජ මහාධිකරණය සහ කොළඹ
දිසා අධිකරණයේ සහ ගාල්ල
දිසා අධිකරණයේ බලයලත්
වෙන්දේසිකරු රාජ්‍ය හා වාණිජ බැංකු
අංක 182, 3 වැනි මහල හල්ෆ්ස්ඩොර්ප් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011 2445393/011 2396520
ඊමේල් : senaservice@sltnet.lk

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහල,
මරදාන පාර, කොළඹ 10
දුරකථන අංක : 011- 2672262/011 2672263
ෆැක්ස් අංකය : 011- 2683073.

08-136

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව දිසා අධිකරණයේ දී ය

ගම්පහ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
වලව්වත්ත - කිඩගම්මුල්ල, ගම්පහ.

...............................පෙත්සම්කරු

*එදිරිව*

නඩු අංකය : 3281/විශේෂ

01. වෙල්ගමගේ අරුණ සම්පත් පෙරේරා,
අංක 358,
පහළ කඳවල, තිඹිරිගස්කටුව.

02. මුණසිංහ ආරච්චිගේ දොන් ෆ්‍රැන්සිස් සුනිල් අප්පුහාමි,
අංක 342 බී, පහළ කඳවල,
තිඹිරිගස්කටුව.

03. විතාරණගේ ජගත් සංජීව ප්‍රනාන්දු,
අංක 29/3,
පහළ කඳවල, තිඹිරිගස්කටුව.

.................................වගඋත්තරකරුවෝ.

ඉහත නම් සඳහන් වග උත්තරකරුවන් වෙතටයි.

මීගමුව දිසා අධිකරණයේ නඩු අංක 3281/විශේෂ දරන නඩුවේ වර්ෂ 2013.03.20 වැනි දින මීගමුව දිසා අධිකරණයේ ගරු අතිරේක දිසා විනිසුරු තැන්පත් රෂන්ත ගොඩවෙල මැතිතුමන් ඉදිරියේ දී සුදුස්සක් කිරීම සඳහා කැඳවූ අවස්ථාවේ දී පෙත්සම්කරුගේ නීතිඥ ජේ. ඩී. ජේ. නිකලස් මහතා විසින් ඉදිරිපත් කරන ලද කරුණු ද, ඉදිරිපත් කර ඇති ලේඛන ද සලකා බලමින්, "පෙ 1" ලෙස ලකුණු කර ඇති ලේඛනය අනුව, බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 3 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 59 (01) වගන්තිය ප්‍රකාරව සහතිකයක් ඉදිරිපත් කර ඇති බව පෙනී යන අතර, ඒ අනුව අදාළ වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව පෙත්සමේ උපලේඛනයේ සඳහන් දේපළ තහනමට ගෙන විකිණීම සඳහා ඇස්කීසි නිකුත් කරන අතර, එය ක්‍රියාත්මක කර වාර්තා කිරීමට නියෝග කර තීන්දු කළ බවට අණ කොට තීන්දු ප්‍රකාශ කරන ලදී.

එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව, පළමුවන වගඋත්තරකරු ක්‍රියා කිරීමට අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර එකී නිශ්චල දේපළ වර්ෂ 2014ක් වූ අගෝස්තු මස 18 වැනි දින පෙ. ව. 10.30 ට එකී දේපළ පිහිටා ඇති තිඹිරිගස්කටුව, පහළ කඳවල, අංක 358 දරන ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් :

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. තක්සේරු ගාස්තු 0.5%ක් ද,
3. වෙන්දේසිය *ගැසට් පත්‍රයේ* පළකිරීමේ ගාස්තු,
4. පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම,
5. අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද,
6. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2.5% ක මුදලක් ද,
7. පළාත් පාලන ආයතනය සඳහා ගෙවිය යුතු 1% ක ගාස්තුව ද,
8. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා වූ සියලු වියදම් ද,
9. රජයේ පවුන්ඩේජ් ගාස්තු ද,
10. ලිපිකරු හා සෝෂක ගාස්තු ද.

ගැණුම්කරු විසින් ඒ අවස්ථාවේ දී ම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම් ගැණුම් මිළෙන් ඉතිරි මුදල වන 75% ක මුදල වැඩ කරන දින 30ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කොටසට අයත් අළුත්කුරු කෝරළයේ දූනගහපත්තුවේ, "කොන්ගහවතුවංගුව" නමැති ඉඩමට ඩබ්ලියු. එස්. එස්. මෙන්ඩිස් බලයලත් මිනින්දෝරු තැන, 1998 ජූලි මස 19 වැනි දින මැන කොටස් කළ අංක 1393 දරන පිඹුරේ අංක 04 දරන කොටසට මායිම්, උතුරට : දීපාල් පෙරේරාට අයිති ඉඩම ද, නැගෙනහිරට : එමලින් පෙරේරාට අයිති ඉඩම ද, දකුණට: අංක 5 දරන කොටස සහ අංක 09 දරන අඩි 10ක් පළල පාර ද, බස්නාහිරට: අංක 03 දරන කොටස ද, මායිම් වූ පර්චස් දහයයි දශම පහ (අ. 0, රූ. 0 පර්. 10.5) ක් හෙවත් හෙක්ටයාර් 0.02656 ක් විශාල ඉඩමේ බිම් සහ ඊට අයත් ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියල්ල ද සමග මාර්ග අයිතිය ද වේ.

(පෙර ලියාපදිංචිය : ඊ 938/85 මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත).

අයි. සී. ඒ. පෙරේරා,
සාම විනිසුරු,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු, වෙන්දේසිකරු,
අංක 86 නව නුවර පාර,
වැලිවේරිය.
033- 2255115
077-3698690.

2014ක් වූ ජූලි මස 11 වැනි දින දී ය.

*වැඩි විස්තර සඳහා :*

නීලා මහත්මිය - 077- 4656121
ජූඩ් මහතා - 077 - 6607653.

කටාන විවිධසේවා සමූපකාර සංගමය,
දෙමංහන්දිය.

08-06

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

ජංගම ගිණුම් අංක : 6533385.
සුපර්කොම් කොම්පියුටර් සිස්ටම් හි උකස් කරන ලද දේපළ විකිණීම

හවුල්කරුවන් - නෙල්ලිගමගේ සරත් ධම්මික පෙරේරා මහතා,
නෙල්ලිගමගේ දයාසිරි බන්දු පෙරේරා මහතා.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.06.13 දිනැති අංක 1867 දරන ගැසට් පත්‍රයේ හා 2014 මැයි 29 වන බ්‍රහස්පතින්දා දින "ඩේලි නිව්ස්", "දිනමිණ " හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.08.23 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### ඉහත සඳහන් පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (වැතර උප කාර්යාලය), සල්පිටි කෝරළේ, උඩුගහපත්තුවේ, අංක 591 දරන සිද්ධමුල්ල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සිද්ධමුල්ල ග්‍රාමයේ පිහිටි "තානායම් ගොඩැල්ල මූකලාන" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි ඇතුළුව බලයලත් මිනින්දෝරු ආර්. ඒ. සිරිසේන විසින් සාදන ලද 1999 මාර්තු 20 දිනැති අංක 337 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කරන ලද ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 1 උතුරට : අංක 355 දරන පිඹුරෙහි ලොට් 19 පාර (ඔප්පුවට අනුව අංක 335 දරන පිඹුරෙහි ලොට් 20) ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : එස්. ධර්මසිරි තේවාහෙට්ටිගේ ට අයත් ඉඩම (ඔප්පුවට අනුව එස්. ධර්මසිරි දේවාහෙට්ටිගේ ට අයත් ඉඩම) ද, බස්නාහිරට : ප්‍රධාන පාර ද මායිම්ව එකී අංක 337 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසි එකක ( අ. 0, රූ. 0, පර්. 21) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 394/75 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

එකී සිද්ධමුල්ල පිහිටි "තානායම් ගොඩැල්ල මූකලාන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. එම්. පී. බී. කරුණාසුන්දර විසින් සාදන ලද 1977 ජනවාරි මස 11 දිනැති අංක 335 දරන පිඹුරෙහි ලොට් 20 (අඩි 20 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 20 උතුරට : ඩී. රූබන්ගේ උරුමක්කරුවන්ට අයත් ඉඩම සහ ලොට් 7, 8, 11, 12, 15 සහ 21 ද, නැගෙනහිරට : ලොට් 19 (පාර) ද, දකුණට : ලොට් 1 සිට 6 දක්වා සහ ලොට් 6, 9, 10, 13, 14, 17 ද, බස්නාහිරට : මාම්පේ සිට කොට්ටාව දක්වා ප්‍රධාන පාර ද, මායිම්ව එකී අංක 335 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහතුනයි දශම පහකින් (අ. 0, රූ. 0, පර්. 13.5) යුක්ත වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 348/241 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බී. කේ. ගුරුසිංහ මහතා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
මහරගම.

08-176

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

(1) ණය යොමු අංකය : 74133382.
මහේෂ් ප්‍රසන්න පින්දෙනිය මහතා සහ මාදම්පගේ දොන් දුල්ශ්‍රියානි මාදම්පගේ මහත්මිය යන අයට අයත් උකස්කරන ලද දේපළ විකිණීම

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.04.10 දිනැති අංක 1827 දරන ගැසට් පත්‍රයේ හා 2013 සැප්තැම්බර් මස 23 වැනි දිනැති "ඩේලි නිව්ස්", "දිනමිණ " හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.09.09 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ 410/සී වහර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිරිඳිවැල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාව තුළ ලුණුගම පිහිටි රදාවලලන්ද නැමති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු කේ. ටී. පී. ආර්. අහුගම්මන විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 01 දිනැති අංක 91 ඒ/1999 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 4 උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 3 ද, මායිම්ව අංක 91ඒ/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයක

(අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී451/291 හි ලියාපදිංචි කර ඇත.

2. එකී ලුනුගම පිහිටි "රදාවලලන්ද" නමැති ඉඩමේ, එහි ඇති ගහකොළ ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව අංක 91 ඒ/1999 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 775 හි ලොට් ඒ ද, දකුණට ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 4 ද, මායිම්ව එකී අංක 91ඒ/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයකින් (අ. 0, රූ. 0, පර්. 16) යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 451/262 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙය අංක 91ඒ/1999 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා ඇති පාරට වෙන් කළ කොටස මතින් හා ඒ දිගට මාර්ග අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. සරත් කුමාර,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
හංවැල්ල.

08-177

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (නගර ශාඛාව)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා කොට්ඨාසයේ බත්තරමුල්ල උප කාර්යාල සීමාවේ දකුණු තලංගම මහකුරුඳුවත්ත පාරේ වරිපනම් අංක 65/21 දරන සාන්ත තෝමස් වත්ත (කොටසක්) වශයෙන් දැක්වෙන දෙල්ගහවත්ත අලුබෝගහලන්ද බතලදෙණියකැලේ බතලවත්තදෙණිය බුන්වැල්ලකොඩැල්ලකැලේ හොරගහමණ්ඩිය කැලේ බටදෙණියකැලේ ගොරකගහවත්ත ඇතුන්කැදෙණිය හොරගහවත්ත නුගගහවත්ත අලුබෝගහදෙණිය සහ අලුබෝගහදෙණියඕවිට නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ හා අනෙකුත් සියලු දේ සමග වන බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු හා බිම් සැකසුම්කරු එස්. වික්‍රමසිංහ විසින් 1993 නොවැම්බර් මස 25 වැනි දින සාදන ලද පිඹුරු අංක 6322 දරන පිඹුරේ ලොට් 1 C 1 දරන කැබැල්ලට (නැවත මැන බෙදාවෙන්කොට 2005 අගෝස්තු මස 11 වැනි දින සාදන ලද බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් සහතික කරන ලද පිඹුරු අංක 1462 හි ලොට් 9 දරන පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වයෙන් යුත් ඉඩම ගොඩනැගිලි සහ ගහකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් සාන්ත තෝමස් වත්තේ කොටසක් වන,

ලොට් 14 (අ. 0, රූ. 0, පර්. 23. 76)
ලොට් 1සී3 (අ. 0, රූ. 0, පර්. 1.5)
ලොට් 1බී (අ. 0, රූ. 0, පර්. 1.5)
ලොට් ඒ9 (අ. 0, රූ. 1, පර්. 6)
ලොට් ඒ5බී (අ. 0, රූ. 0, පර්. 21.6)

ඉහත සඳහන් ඉඩම්වලින් ඇති ප්‍රවේශ අයිතිය සමග වේ.

ගිනිගේ නලින් රවින්ද්‍ර ප්‍රනාන්දු ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2014 ක් වූ අගෝස්තු මස 22 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2014.08.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2014.08.04 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - බත්තරමුල්ල නගර මධ්‍යයේ සිට තලවතුගොඩ පාරේ ගියවිට කුමාරගේ වත්ත හංදිය හමුවේ. එතැනින් කුමාරගේවත්ත පාරේ මීටර් 300ක් පමණ දුර ප්‍රමාණයක් ගිය විට මහකුරුඳුවත්ත පාර හමුවේ. එම පාරේ වරිපනම් අංක 65/21K මහකුරුඳුවත්ත දරන අදාළ දේපළ පිහිටා ඇත. (සෙලින්කෝ නිවාස සංකීර්ණය) තලවතුගොඩ දකුණ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පලාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. අකාලික වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි.
08. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නගර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,
අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය 011- 2445393
ඊමේල් senaservice@sltnet.lk

කළමණාකරු (ණය අයකර ගැනීම්),
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 21,
ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01
දුරකථන අංක : 011 - 2486770
ෆැක්ස් අංකය : 011- 2347717.

08-135

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොලොන්නාව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2012.04.04 දිනැති සහ අංක 4332 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යෝගේන්ද්‍රම් යෝගදේවි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2014ක් වූ අගෝස්තු මස 19 වැනි දින පෙ. ව. 9.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය බල ප්‍රදේශයේ වැලිසර උපකාර්යාල සීමාව තුළ වැලිසර පිහිටි වරිපනම් අංක 046/1 වැල්ලහේන 3 වැනි පටුමගෙහි පිහිටි කුරුඳුවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. පී. අබේනායක විසින් මැන සාදන ලද 2003.07.13 දිනැති අංක 3350 දරන පිඹුරේ ලොට් 21ඒ 2 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි ඇතුලුව එහි තිබෙන සෑම සියලු දේත්.

විශාලත්වය පර්චස් දහතුනයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 13.25)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.03.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2013.03.08 වැනි දින ලක්බිම, තිනකරන් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම. -* මහබාගේ හන්දියේ සිට මීගමුව පාරේ ඩී. ෂෙල්ටන් ජයසිංහ මාවත දක්වා කි. මී. 0.3ක් පමණ ගමන් කරන්න. එතැනින් දකුණට හැරී ඩී. ෂෙල්ටන් ජයසිංහ මාවතේ ශාන්ත මරියා පාර දක්වා මීටර් 700ක් පමණ ඉදිරියට යන්න. එතැනින් වමට හැරී ශාන්ත මරියා පාරේ මීටර් 300ක් පමණ ගොස් දකුණට හැරී මෙම පාරේ මීටර් කිහිපයක් ගිය විට එම පාරේ දකුණු අත පැත්තේ ඇති අදාළ දේපළට ළඟාවිය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
(දුරකථන අංකය : 2661826, 2661835)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0112 - 337707 0777- 378441, 0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 337707

08-168

---

**මහජන බැංකුව - අවිස්සාවේල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය යටතේ මා විසින් 2014.08.15 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**1441 දරන උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩගහ පත්තුවේ සීතාවකපුර නගර සභා සීමාව තුළ උක්වත්ත ග්‍රාමයේ පිහිටි "හොනිමන් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. බී. පී. ජයලත් කුමාර මහතා විසින් මැන සාදන ලද අංක 103 දරන පිඹුරේ ලොට් අංක 1 සඳහා මායිම් උතුරට : කැබලි අංක 1412 නැගෙනහිරට : කැබලි අංක 59 ද, දකුණට : කැබලි අංක 143 ද, බස්නාහිරට : මාර්ගය ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිහයි දශම පහ (අක්. 0 රූ. 0 පර්. 30.5)ක් විශාල ඉඩම.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ආකාරයට නැවත මැන සාදන ලද්දකි.

ඉහත කී " හොනිටන් වත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු මහතා 1965.06.05 වැනි දින අංක 516 දරන පිඹුරේ ලොට් අංක 142 වශයෙන් ලකුණු කර ඇති (අක්. 0 රූඩ් 0 පර්. 31.02) විශාල ඉඩම වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී. 170/203 යටතේ ලියාපදිංචි කර ඇත.

වැඩි විස්තර සඳහා 2014.01.24 රජයේ ගැසට් පත්‍රයේ ද, 2014.02.24 දිනැති දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළ වූ වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*මාර්ග විස්තරය.* - අවිස්සාවේල්ල නගරයේ සිට කොළඹ දෙසට කි. මීටර් 1ක් පමණ ගොස් වම් පසට ඇති කුඩගම පාරේ මීටර් 100ක් පමණ ගියවිට වමට ඇති හොනිටන් පෙදෙස පාරේ කි. මීටර් 1ක් පමණ ගිය විට පාරට දකුණු පසට මායිම්ව හොනිටන් පෙදෙසේ අංක 82 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2014.08.15 වැනි දින පස්වරු 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස්කර අංක 1616 දරන දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර හේවාගම් කෝරළේ උඩුගහපත්තුවේ සීතාවක නගර සීමාව තුළ පුවක්පිටිය ග්‍රාමයේ පිහිටි "ටොකෝ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. පී. ජයලත් කුමාර මිනින්දෝරු මහතා විසින් 2006.08.07 වැනි දින මැන සාදන ලද අංක 2555 දරන පිඹුරේ ලොට් අංක 1 සහ මායිම්, උතුරට සහ නැගෙනහිරට ලෙච්චමී අම්මාට අයිතිව තිබූ "ටෝකෝ වත්ත" කොටසක් ද, දකුණට : ආර්. ඒ. බේබිනෝනාට අයිතිව තිබූ ඉඩම ද, බස්නාහිරට : කොළඹ අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගය ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දෙකයි දශම හතයි බිංදුව (අක්. 0 රූඩ් 01 පර්. 2.70) විශාල ඉඩම වේ.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩම් ඒකාබද්ධ කර සාදා ඇත.

සීතාවක නගර සභා සීමාව තුළ උක්වත්ත ග්‍රාමයේ පිහිටි "හොනිටන් වත්ත" 2005.12.04 පිඹුර අංක 2005/230 ලොට් ඒ රූඩ් දෙකයි පර්චස් විසිනවයයි දශම පහ (අක්. 0 රූඩ් 2 පර්. 29.5) විශාල ඉඩම.

අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී. 167/208 පී 131/273 පී 134/46 පී 131/147 යටතේ ලියාපදිංචි වී ඇත.

*මාර්ග විස්තරය* .- අවිස්සාවේල්ල නගර මධ්‍යයේ සිට කොළඹ පාරේ කි. මීටර් 3.0ක් පමණ පැමිණි විට එම පාරට මායිම්ව වමපස පුවක්පිටියේ මෙම දේපළ පිහිටා ඇත. මෙම දේපළ සී ට්‍රේඩ් සෙන්ටර් සහ " චන්ද්‍රා කෙමිකල්ස්" නමින් හැඳින්වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ, අංක 177 ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ , ප්‍රාදේශීය කළමනාකරු, (කොළඹ පිටත) ගෙවිය යුතු ය.

දුරකථන අංක : 825102, 825101, 817737

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145
0718021206.

08-183/1

---

**මහජන බැංකුව - පළමු නගර ශාඛාව (046)**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ රාගම පත්තුවේ වත්තල මාබෝලේ නගර සභා සීමාව තුළ පිහිටියාවූ ද දෙල්ගහවත්ත යයි කියනු ලබන ඉඩමේ පර්චස් තුනයි දශම තුනයි එකක් (අක්. 0 රූ. 0 පර්. 3.31) සහ එහි පිහිටි ගොඩනැගිලි ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014ක් වූ අගෝස්තු මස 16 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2008.09.05 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයේ සහ 2008.08.22 දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීම්වලට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - හැඳල හන්දිය පසුකර කි. මී. 01ක් පමණ යාමේ දී මාබෝල, මීගමු පාරට මුහුණ ලා දකුණු පස අදාළ ස්ථානය පිහිටා ඇත

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර ප්‍රාදේශීය කළමනාකරු, (කොළඹ දකුණ) ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (බටහිර 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2344982, 2393678 ෆැක්ස් අංකය : 4717009

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145,
0718021206.

08-183/2

---

**ඩී එෆ් සී සී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 696 සහ 15326 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කීරවැලි පත්තුවේ, වරකාපොළ නගර සභා සීමාවට අයත්, පිලන්දූව ග්‍රාමයේ පිහිටි, අම්බලන් ඕවිටවත්ත වැල්ලගමවත්ත සහ වෙලෙකෙලියෙපහළවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2005 ජූලි මස 06 වැනි දිනැති අංක 5110 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 02, පර්. 10 එහි පිහිටි සියල්ල සහිතව

ඉහත කී දේපළ බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද 1982 මාර්තු මස 13 වැනි දිනැති අංක 1636 දරන පිඹුරේ නැවත මිනුමකි.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. එන්. කේ. ඉලංගන්තිලක විසින් සහතික කරන ලද, 2005 දෙසැම්බර් මස 16 වැනි දිනැති අංක 696 සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වදුරගල විසින් සහතික කරන ලද, 2009 පෙබරවාරි මස 25 වැනි දිනැති අංක 15326 දරන උකස්කරයන් ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නීතිගත වූ ලියාපදිංචි අංක N (PVS) 19620 දරන එහි ලියාපදිංචි කාර්යාලය අංක 356 අබේපුස්ස වරකාපොල පිහිටි (මින්මතු සමාගම ලෙස හැඳින්වෙන) සී/ස එච් කේ බෙලින් ඇන්ඩ් සන්ස් (පුද්ගලික) සමාගම විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014 අගෝස්තු මස 19 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිලෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 75,000.00ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුවර ෑ. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළ ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංකය : 011- 2442442

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593.
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408.
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-185

## ප්‍රසිද්ධ වෙන්දේසිය

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීම

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරුවිල් පත්තුවේ, කළුවංචිකුඩි ගමෙහි පිහිටි ඊස්ටන් සීටන් එස්ටේට්/ගෘෆ් නමැති බෙදා වෙන් කළ ඉඩම ප්‍රමාණය අක්කර එකයි (අ. 01, රූ, 0 පර්. 0) අක්කර එකක් විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේත් සමඟ මෙම ඉඩම අංක එච් 152/208 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම බලයලත් මිනින්දෝරු වී රාජේන්ද්‍රන් විසින් ඇඳ සාදන ලද අංක ආර්/010/2011 සහ 2011.01.03 දිනැති මානක පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරුවිල් පත්තුවේ මන්මුනායි දකුණු එරුවිල් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්මුනායි දකුණු එරුවිල් පත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ කළුවංචිකුඩි ගමේ පිහිටි ඊස්ටන් සීටන් නමැති බෙදා වෙන් කළ ඉඩමට බලයලත් මිනින්දෝරු වී. රාජේන්ද්‍රන් විසින් ඇඳ සාදන ලද අංක ආර්/010/2011 සහ 2011.01.03 දිනැති මානක පිඹුර ප්‍රකාර ඉඩම ප්‍රමාණය අක්. 01 රූඩ්. 00 පර්. 00 අක්කර එකක් හෙවත් හෙක්ටයාර් 0.4047 විශාල ඉඩම් ගොඩනැගිලි ළිඳ ඇතුලු ඊට අයිති සෑම සියලු දේත් සම

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී කනගරත්නම් විසින් සහතික කරන ලද අංක 5091 සහ 201.09.21 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය "වරදරාජා රෝහිණී" යන අය බන්ධනදායි/උකස්කරු වශයෙන් කොළඹ 03 ගාළු පාරේ අංක 64 හි යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී "වරදරාජා රෝහිණී" විසින් පැහැර ඇති හෙයින්,

යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී විසින් අපහට පවරා ඇති බලය ප්‍රකාරව 2014ක් වූ අගෝස්තු මස 25 වැනි දින පෙ. ව. 10.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මඩකලපුව යුනියන් බැංකුවේ සිට ත්‍රිකුණාමලය පාරේ කි. මී. 1/2 පමණ ගමන් කළ විට දකුණට ඇති බාර් පාර සහ කල්මුනෙයි පාරේ කි. මී. 26ක් පමණ ගමන් කළ විට කළුවංචිකුඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුව පසුකොට පන්සල තෙක් ගමන් කොට වමට ඇති ගුරුපාරට හැරී මීටර් 30ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ ශක්ති ඉල්ලම් පාරේ හන්දිය අසළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පීඑල්සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සෝෂක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව, යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී, අංක 64, ගාළු පාර, කොළඹ 03
දුරකථන අංක 011-2374100

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල,
හල්ෆ්ස්ඩෝප් වීදිය, කොළඹ 12
දුරකථන අංකය : 0773 181891.

08-192

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංකය : ජීඑල්/08/01214/ජීඒ1/750.

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.05.26 වැනි දින ගැසට් පත්‍රයේ සහ 2010.09.27 වැනි දින දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය , වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තරකර ඇති දේපළ හා භූමිය වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40, බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2014.09.03 වැනි දින පස්වරු 2.30 ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිතුලම්පිටිය පිහිටි පඳුරේ වත්ත නොහොත් කොහොඹන්ගෙවත්ත ඉඩමට 1997.06.01 සහ 1997.05.24 දින බලයලත් මිනින්දෝරු ඩී. ඩී. රණවීර විසින් මැන සකසන ලද අංක 3281 දරන (අංක 3282 ලෙස වැරදි ලෙස ලියාපදිංචි වී ඇති) පිඹුරේ කැබලි අංක 06 ලෙස බෙදා වෙන්කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර 0 රූඩ් 0 පර්. 34.125 ක වූ බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ වේ.

මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 460/267 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩ බලන සාමාන්‍යාධිකාරිණී.*

2014 ජූලි මස 18 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

08-196

---

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීම

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළෙයි පත්තුවේ, පාසිකුඩා ගමේ පිහිටි කරුන්කලිච්චෝලෙයි ඉඩමේ කොටසක්,
ප්‍රමාණය අක්කර 00 රූඩ් 02 පර්චස් 00

රූඩ් 02ක් විශාල ඉඩම් කොටස. මෙම ඉඩම අංක ජී258/55 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම බලයලත් මිනින්දෝරු ටී. එලවරසු විසින් ඇඳ සාදන ලද අංක ඊ/155/2011 සහ 201107.15 දිනැති මානක පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ පාසිකුඩා ගමේ පාසිකුඩා පාරේ කරුන්කලිච්චේනෙයි ඉඩමේ කොටසකට බලයලත් මිනින්දෝරු ටී. එලවරසු විසින් ඇඳ සාදන ලද අංක ඊ/155/2011 සහ 2011.07.15 දිනැති මානක පිඹුර ප්‍රකාර ඉඩම,
ප්‍රමාණය අක්කර : 00 රූඩ් 02 පර්චස් 00

රූඩ් 02ක් හෙවත් හෙක්ටයාර් 0.202343 විශාල ඉඩම් කොටස සහ ඊට අයිති සෑම සියලු දේත් සමග.

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වේදවානම් කනගරත්නම් විසින් සහතික කරන ලද අංක 5022 සහ 2011.08.29 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 5136 සහ 2011.10.05 වැනි දින දරන ද්විතියික උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥාපනත ප්‍රකාරව අංක DS/MN/C/BR992 යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද බෙනාල් කන්ස්ට්‍රක්ෂන් යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ඊ යන අය බන්ධනදායි/ උකස්කරු වශයෙන් කොළඹ 03 ගාලු පාරේ අංක 64 හි යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී "බෙන්ජමින් ජයකුලේන්ද්‍රන්" විසින් පැහැර ඇති හෙයින්,

යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව 2014ක් වූ අගෝස්තු මස 26 වැනි දින පෙ. ව. 10.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ-කුරුණෑගල-දඹුල්ල-හබරණ-මඩකලපුව පාරේ කි. මී. 286ක් පමණ ගොස් කිරන් නගරයේ කුඹුර්මූලෙයි හන්දියෙන් වමට හැරී ප්‍රාදේශීය සභා පාරේ කි. මී. 5 1/2ක් පමණ ගමන් කළ විට කල්කුඩා හන්දියට පැමිණ, එතැන් සිට ප්‍රාදේශීය සභා පාරේ මීටර් 500ක් පමණ ගමන් කළ විට දකුණට ඇති පුද්ගලික පාරට හැරී තවත් මීටර් 150ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සෝෂක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී, අංක 64, ගාලු පාර, කොළඹ 03, දුරකතන අංක : 011-2374100

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල,
හල්ෆ්ස්ඩෝප් වීදිය, කොළඹ 12
දුරකථන අංකය : 0773 181891.

08-193

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| අගෝස්තු | 2014.08.01 | සිකුරාදා | 2014.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.08 | සිකුරාදා | 2014.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.15 | සිකුරාදා | 2014.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.22 | සිකුරාදා | 2014.08.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.29 | සිකුරාදා | 2014.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2014.09.05 | සිකුරාදා | 2014.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.12 | සිකුරාදා | 2014.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.19 | සිකුරාදා | 2014.09.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.26 | සිකුරාදා | 2014.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2014.10.03 | සිකුරාදා | 2014.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.10 | සිකුරාදා | 2014.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.17 | සිකුරාදා | 2014.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.24 | සිකුරාදා | 2014.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.31 | සිකුරාදා | 2014.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.